www.shraddha.lk



# පුදමු මාපිය ගුරුවර වැඩිහිටි උතුමන්

පිටු අංක 39





ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව

උත්සාහයෙන් වීර්යයෙන් ජීවිතය ජයගන්නට
මෙර දරනා පින්වන්ත දූ පුතුන් උදෙසා...

ශ්‍රී බුද්ධ වර්ෂ 2562
ව්‍යවහාර වර්ෂ 2018
මැයි, ජූනි, ජූලි, අගෝස්තු


චුල්ලකාල මහාකාල තෙරුන් වහන්සේලාගේ කථා වස්තුව
පිටු අංක 12

සෙනෙහෙබර ආමන්ත්‍රණය
පිටු අංක 21

අපණ්ණක ජාතකය
පිටු අංක 27

නිර්මාණ ඉසව්ව
පිටු අංක 46

ධර්ම මාර්ගයේ හැසිරෙන පිනැත්තෝ වෙමු
පිටු අංක 50



මහා කාරුණික වූ අග්‍රේශ්වර වූ සියලු දෙව් මිනිසුන් හට
විමුක්තියේ මාර්ගය විවර කළ ශ්‍රීමත් සුගත තථාගත
ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේට අපගේ නමස්කාරය වේවා!



මහමෙව්නාව භාවනා අසපු සංචිතයේත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේත්
නිර්මාතෘවර සහ ප්‍රධාන අනුශාසක
අතිපූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ.

**ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතිය සඳහා සෙනෙහසින් අවවාද අනුශාසනා කරමින් අප හට නිරතුරු මග පෙන්වන අපගේ ගුරුදේවෝත්තම කල්‍යාණමිත්‍ර**
**පින්වත් ලොකු ස්වාමීන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !**

මහමෙව්නාව
භාවනා අසපුව

ශ්‍රද්ධා
රූපවාහිනිය

ලක්විරු
ගුවන්විදුලිය
LAKVIRU RADIO

අනේක දුක් කම්කටොලු මැද
උපයාගත් මුදල් තුටු සිතින් ම
ජීවිතය ජය ගන්නට වෙර දරන
දැයේ දූ දරුවන්ට
මහත් සෙනෙහසින් දයාද කරන
දයාබර කැපකරු මව්පියවරුන් සියලු දෙනා ද
අනේක දුක් කම්කටොලු මැද
ගුණයෙන් නුවණින් පිරිපුන් අනාගතයකට
පෙරමං තනන ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී
පින්වත් දරුවන් සියලු දෙනා ද
නිදුක් වෙත්වා ! නීරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා !
දුර්ලභව ලද මිනිස් ජීවිතය
නිමවන්නට මත්තෙන් ඉතා සුවසේ ම
උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට
මේ දුක්ඛිත සසර ගමනින්
නිදහස් වීමේ වාසනාව ලබත්වා!

නමෝ බුද්ධාය!

ශ්‍රී බුද්ධ වර්ෂ 2562ක් වූ ජූනි මස 22 වන දින දී ය.

දයාබර දුවේ, පුතේ,

විදුලිය සොයා ගැනීම මිනිස් ලෝකයේ සිදු වූ සුවිශේෂී විප්ලවයක් ලෙසයි සැලකෙන්නේ. දුව පුතා මේ ගැන පාසලේ දී ඉගෙනගෙන ඇති. නව කාර්මික ප්‍රවණතාවයන් සියල්ලට ම පාහේ හේතු වුණේ විදුලිය සොයා ගැනීම. ඒ ගැන සොයා බැලුවොත්, එදිනෙදා ජීවිතයේ පහසුව ඇති කරලන සියලු ම උපකරණ නිර්මාණය කොට තිබෙන්නේ විදුලිය පාදක කරගෙන බවයි පෙනී යන්නේ.

විශේෂයෙන් ම මේ යුගය වන විට රූපවාහිනිය, ස්මාර්ට් දුරකථන, ටැබ් යන්ත්‍ර, ලැප්ටොප් සහ පරිගණක ආදී උපකරණ ලොකු කුඩා වෙනසක් නැතිව බොහෝ ම කැමැත්තෙන් සහ උනන්දුවෙන් භාවිත කරන බව අපට දකින්න ලැබෙනවා. ඒ උපකරණ ඔස්සේ ඉතා වේගයෙන් තොරතුරු ගලා යාම සිදු වනවා. ඒ වේගයෙන් ම අපේ සිතුවිලි, චර්යාවන් පවා වෙනස් වන්නට පුළුවනි.

අපේ තොරතුරු බාහිරටත්, බාහිර තොරතුරු අපටත් ලෙසින් සිදුවන මේ තොරතුරු ගලා යාම තුළ දී අපට ප්‍රතිලාභයන් සැලසෙනවා වගේ ම අවාසි ද සිදු වනවා. ඔබට නව දැනුම ගලා එන මාධ්‍යයක් ලෙසින් මෙම විද්‍යුත් උපකරණ භාවිත කරන්නට පුළුවනි. අධ්‍යාපනික වශයෙන් එය ඔබට ලොකු පහසුවක්. සැබැවින් ම විදුලිය භාවිතයෙන් නොයෙක් උපකරණ නිර්මාණය කිරීමෙන් මිනිසුන් අපේක්ෂා කළේ එදිනෙදා කටයුතුවල පහසුව සලසා ගැනීම යි. නමුත්, අප ඒ උපකරණ භාවිත කරන්නේ පහසුව පිණිස පමණක් ම ද?

අම්මා තාත්තා "එපා" කියද්දී ම දවසේ පැයක් දෙකක් හෝ ඊටත් වඩා වැඩි කාලයක් කාටුන් නරඹන, ටෙලිනාට්‍ය නරඹන දරුවන් ගැන අපට අසන්නට ලැබෙනවා. වීඩියෝ ගේම්වලට ඇබ්බැහි ව ඉඩ ලැබුණු සැණින් එහි යෙදෙන දරුවනුත් සිටිනවා. ඇතැම් විට වෙඩි තබන, බෝම්බ පුපුරුවන, මිනිසුන් මරා දමන ක්‍රීඩාවලයි ඒ අය බොහෝ කැමැත්තෙන් යෙදෙන්නේ. ඒ වගේ ම මේ දේවල් හරහා නොයෙක් අපරාධයන්ටත්, අපචාරයන්ටත් සිත පොළඹවන ආකාරයේ සිත් ඇදගන්නා සුලු මිහිරි රූපවලින්, වචනවලින් යුතු බොහෝ දේ අප කරා පැමිණෙනවා. මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වන, අසභ්‍ය දේ නැරඹීමට ඇබ්බැහි වන, සල්ලාලයන්ගේ ගොදුරු බවට පත් වන පිරිස් ගැන අප අසා තිබෙනවා. එවැනි ඛේදනීය තැනක අප නතර වුණාහොත්... පහසුව පිණිස නිපැයූ දේ නිසා ම නොයෙක් ආකාරයෙන් අකුසල රැස් කරන පිරිසක් බවට අප පත් වනවා නේ ද? පහසුව පිණිස නිපැයූ දේ නිසා ම අපහසුවට ලක් වන පිරිසක් බවට අප පත් වනවා නේ ද?

දුවේ පුතේ, හොඳ නරක තෝරා බේරා ගත හැක්කේ හිතා මතා යමක් කිරීමේ හැකියාව සහිත වූ අපට මිස යාන්ත්‍රික උපකරණවලට නො වෙයි. හොඳින් හසුරුවා නොගන්නා හිතේ ස්වභාවය, කැමති තැන නතර වීම යි. එය හුදෙක් ම ආවේගයක් පමණයි. හොඳ නරක තෝරා බේරා ගැනීම ගැන සිතට පුරුදු පුහුණු කොට නොතිබුණාහොත් මේ විද්‍යුත් උපකරණ ඔස්සේ වේගයෙන් අප වෙත පැමිණෙන රාග, ද්වේෂ, මෝහ මූලික අකුසලයන්ගේ ගොදුරක් බවට අප පත් වීම කිසිසේත් ම වළක්වන්නට නොහැකියි. එවිට මාපිය, ගුරුවර, වැඩිහිටියනට කීකරු නොවන, වරදට ලැජ්ජා නොවන, එහි විපාකයන්ට බිය ද නො වන, ඒ හේතු කරගෙන ජීවිතයේ යහපත සලසන ලැජ්ජා බය නම් වූ දේවධර්මයන් නසා ගත් ජීවිතයකුයි උරුම වන්නේ. එවන් ජීවිතයකින් නම් කවර පහසුවක්වත් සැලසෙන්නේ නැහැ.

යම් දෙයක් හේතුවෙන් තමා තුළ උපන් කුසල් දහම් පවා පිරිහෙනවා නම්, නූපන් කුසලයන් උපදින්නේ නැති නම්, නූපන් අකුසලයන් උපදිනවා නම්, උපන් අකුසලයන් ද වැඩී යනවා නම් එවැනි දේ ඇසුරු නොකිරීම යි අප කළ යුත්තේ. ඒ නිසා, පහසුව පිණිස මිනිසුන් විසින් ම නිර්මාණය කරන ලද උපකරණ භාවිතයේ දී ඔබ ඔබේ සීමාව ගැන වඩාත් සැලකිලිමත් වෙන්න. ඒවා සමඟ කරන ගනුදෙනුව තුළින් ඔබ ව දුක් විපාක උපදවන අකුසලයන් කරා යොමු කරවීම වළක්වන්නට හැක්කේ ඔබට ම යි. සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක දරුවෙකු ලෙසින් කුසලයේ පිහිටා කටයුතු කිරීම තෝරා ගන්නට ඔබ කැමති වෙන්න. ඒ අභිමානය සිතේ දරාගෙන, පහසුව පිණිස විද්‍යුත් උපකරණ භාවිත කරනවා ම මිස එහි ගොදුරක් නොවන්නට වග බලා ගන්න.

පින්වත් දුවට, පුතාට තුණුරුවනේ අනන්ත ආශිර්වාද බලයෙන් සුවසේම අධ්‍යාපන කටයුතු සිදුකරන්නටත්, වාසනාවන්ත ජීවිතයක් උපදවා ගන්නටත්, සුවසේම උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරමින් සංසාර දුකින් අත්මිදෙන්නටත් වාසනාව උදා වේවා!

තෙරුවන් සරණයි!

ගෞතම බුදු සසුන තුළ මෙත් සිතින්,
පූජ්‍ය අලුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ
(ගරු අනුශාසක - ශ්‍රද්ධා මාධ්‍ය ජාලය)

# පටුන

01. චුල්ලකාල මහාකාල තෙරුන් වහන්සේලාගේ කථා වස්තුව 10

02. සෙනෙහෙබර ආමන්ත්‍රණය 19

03. අපණ්ණක ජාතකය 25

04. පුදමු මාපිය, ගුරුවර, වැඩිහිටි උතුමන් 37

05. නිර්මාණ ඉසව්ව 44


06. ධර්ම මාර්ගයේ හැසිරෙන පිනැත්තෝ වෙමු 48

අමා දම්රස වෑහෙන විස්තරාර්ථ

# ධම්ම පදය

(යමක වර්ගය)

පූජ්‍යපාද කිරිබත්ගොඩ ඤාණානන්ද
ස්වාමීන් වහන්සේ



රහතන් වහන්සේලාව බලෙන් වත් කාමයට
පොළොඹවා ගන්න බෑ...

# චුල්ලකාල මහාකාල තෙරුන් වහන්සේලාගේ කථා වස්තුව

**"අසංවර වූ හීන වීරිය ඇති කෙනාට කිසි දියුණුවක් ලබන්නට බැහැ. සංවර වූ වීරියවන්ත කෙනා හැම දෙයම ජය ගන්නවා."**

පින්වතුනේ, පින්වත් දරුවනේ, ඒ කාලයේ දඹදිව සේතව්‍ය කියල නගරයක් තිබුණා. එහි මහාකාල, මජ්ඣිමකාල, චුල්ලකාල කියල පුතාල තුන් දෙනෙක් සිටින පවුලක් තිබුණා. ඔවුන් රැකියාවට කළේ වෙළඳාමයි. වෙළඳාම නිසා ඔවුන්ගේ අතමිට සරු වුනා. මහා ධනවතුන් වුණා. එක් කාලෙක මහාකාල නම් වූ වැඩිමහලු සොහොයුරාත්, චුල්ලකාල නම් වූ බාල සොහොයුරාත් වෙළඳාම පිණිස සැවැත් නුවරට පැමිණියා. සැවැත් නුවරදී මේ වෙළඳ සොහොයුරන්ට බුදුරජාණන් වහන්සේ ගැන අසන්නට ලැබුනා. මුළු නගරයම සාමකාමියි. බොහෝ නිවෙස්වල සවස් යාමයේ තෙරුවන් වන්දනා කොට භාවනා කරනවා. බණකතා අසනවා, හරිම ප්‍රීතියෙන් කල් ගෙවනවා. මේ වෙනස ගැන වෙළඳ සොහොයුරන් පුදුමයට පත් වුණා. ඔවුන්ටත් සැවත් නුවර ජේතවනාරාමයට යන්නට ආශා හිතුණා.

දිනක් සවස් යාමයේ මේ දෙදෙනා දෙව්රම් වෙහෙරට ගියා. බුදුරජාණන් වහන්සේව දැකගත්තා. එදා බුදුරජාණන් වහන්සේ ඉතාම ලස්සනට උතුම් ධර්මය කියා දුන්නා.

"මේ ඉපදෙන මැරෙන සසර ගමන ඉතාම භයානකයි. සිතේ ඇති වෙන ලෝභයත්, ද්වේෂයත්, මුලාවත් නිසා සත්වයන් කෙලෙසී යනවා. එසේ කෙලෙසී ගිය මිනිසුන් සිත, කය, වචනය යන තිදොරින් කර්ම රැස් කොට අපායෙහි ඉපදෙනවා. නමුත් චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගත්තොත් මේ ප්‍රශ්නය විසඳාගන්න පුළුවනි. කෙනෙකුට ඒ වෙනුවෙන් මුළු ජීවිතයම කැප කළොත් ලෝභ, ද්වේෂ, මෝහ යන

අකුසල්වලින් සම්පූර්ණයෙන්ම නිදහස් වෙන්න පුළුවනි. සාමාන්‍ය ගිහි ජීවිතයක් ගත කරමින් ආර්ය අෂ්ටාංගික මාර්ගය පුරුදු කරද්දී සෑහෙන වෙහෙසක් ගන්න වෙනවා. ඒකට හේතුව කාම සැපයටමයි ගිහි ජීවිතය තියෙන්නේ. කෙලෙස් උපදින මාවතක් වගෙයි. හැමතිස්සේම මොකක් හරි දෙයකට හිත බැඳිලා යනවා. ඒ වුණාට මේ පැවිදි ජීවිතය නම් හරීම නිදහස්. ආකාශය වගෙයි...."

මේ වෙළඳ සොහොයුරන් දෙදෙනා බණ අසාගෙන සිටියා. මහාකාල හිටියේ ඉතාම හොඳින් සවන් දීගෙනයි. බුදුරජාණන් වහන්සේ වදාළ හැම බණ පදයක්ම මෙයාට අවබෝධ වුණා. මෙතරම් උතුම් අවස්ථාවක් ආයෙ කවදාවත් ලැබෙන එකක් නැහැ කියලා මෙයාට තේරුණා. බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරලා ගන්ධ කුටියට වැඩියා. මහාකාල ලොකු කල්පනාවකට වැටුණා. එය චුල්ලකාලට මෙහෙම කිව්වා.

"මල්ලියේ, ඔයා ගෙදර යන්න. වෙළහෙළඳාම් කටයුතු කර ගන්න. අනෙක් අයට හොඳින් සළකන්න. මං මහණ වෙනවා. මං ආයෙමත් ගිහි ගෙදරට බැඳෙන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේව මුණ ගැසුණු වෙලාවේ මේ ලැබුණු දුර්ලභ අවස්ථාව අත්හැරගන්න මම කැමති නැහැ."

"එහෙම කොහොමද? එතකොට ඒ අක්කලාට මං මොකක්ද කියන්නේ? දරුවන්ට මං මොනවද කියන්නේ? අපි මෙච්චර මහන්සියෙන් කරපු ව්‍යාපාර කඩාකප්පල් කරන්නද ඔයා හදන්නෙ? අනික ඔය ඕනතරම් ගිහි ගෙදර ඉඳගෙන මිනිසුන් ධර්මයෙහි හැසිරෙන්නේ. ඉතින් ඔයාටත් පුළුවන්නෙ එහෙම කරන්න."

"නෑ මල්ලියේ, මිනිසුන් ඕන කෙනෙක් එහෙම කරපුවාවේ. මට ඕන ඒක නොවෙයි. බුදුරජාණන් වහන්සේ ගිහි ජීවිතය අත්හැරලා පැවිදි ජීවිතයක් ගත කරගෙන නිවන හොයාගෙන ගියා. උන්වහන්සේ ධර්මය අවබෝධ කළා. මේ ජීවිතය තුළදීම ඒ නිවන අවබෝධ

කිරීම පිණිස පැවිදි ජීවිතයේ වටිනාකම පෙන්වලා දුන්නා. ඉතින් මේ අවස්ථාව මට මගහැරුණොත් ආයෙ ආයෙමත් මට උපදින්න සිද්ධ වේවි. ඒ නිසා මල්ලියේ, මං නැවත ගෙදර යන්න කොහෙත්ම කැමති නෑ. මං මේ සෑම දෙයක්ම අත්හරිනවා. මට ඕන කරන්නේ මේ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කිරීම විතරයි."

අයියයි, මල්ලියි දෙන්නා ඔය විදිහට වාද කළා. අන්තිමේදී අයියා ජයගත්තා. මල්ලි කල්පනා කළේ වෙන දෙයක්.

'ඔව්, අයියා මහණ වුණාට කමක් නෑ. පැවිදි වීම කියන්නේ හොඳ දෙයක් නෙ. අයියත් මහණ වෙනවා නම්, මං විතරක් තනියම ආපහු යන්නේ මොකටද? එහෙම නම් මමත් මහණ වෙනවා" කියලා හිතාගෙන එයා මහාකාලට මෙහෙම කිව්වා.

"ඔව් අයියේ, ඔයා හරි. කොහොම වුනත් අපි කවුරුත් වයසට ගිහින් මැරිලා යනවා නෙ. අපි කරපු පින්පව් අරගෙන යනවා නෙ. ඉතින් හැම දෙයක්ම මේ ජීවිතයේ අවසන් කරලා නිවන අවබෝධ කරන එක හොඳයි කියලා මමත් කල්පනා කළා."

මහාකාලට හරිම සතුටුයි. එයා මල්ලිව සතුටින් වැළඳගත්තා. ඒ දෙදෙනා ඉතාමත් සතුටින් පැවිදි වුණා.

පැවිදි වුණාට පස්සේ මහාකාල ස්වාමීන් වහන්සේ ඒ පැවිද්ද ගැන ඉතාමත් වගකීම් සහිතව කල්පනා කළා. බුදුරජාණන් වහන්සේ උගන්වන ආකාරයටම සිත, කය, වචනය හසුරුවන්නට ඕන කියල දැඩි ලෙස අධිෂ්ඨාන කරගත්තා. කළණ මිතුරන්ගේ ඇසුරේම කල්ගත කරන්න හිතට ගත්තා. ඒ නිසා මහාකාල ස්වාමීන් වහන්සේ ඉතාම සිල්වත් කෙනෙක් වුණා. ඇස්, කන් ආදී ඉඳුරන් හොඳට සංවර කරගත්තා. දමනය වුණා. හිත ඇවිස්සෙන ළාමක දේවල්වලට ඉඩ දුන්නේ නැහැ. දානය වැළඳුවෙත් ජීවිතය පවත්වා ගැනීමට විතරමයි. රස තෘෂ්ණාවට හසු වුණෙත් නැහැ. ශ්‍රද්ධාව හොඳින් පැවැත්වුවා.

ගෙවෙන හැම තත්පරයකින්ම උපරිම ප්‍රයෝජන ගත්තා. වීරියවන්ත වුණා. සමාධිය දියුණු කළා. සුළු කලකදී අකම්පිත සිත් ඇති රහතන් වහන්සේ නමක් බවට පත් වුණා.

නමුත් චුල්ලකාල ස්වාමීන් වහන්සේ ජීවිතයේ ඇති බැරෑරුම්කම ගැන කල්පනා කළේ නෑ. කම්මැලිකමෙන් කල්ගත කළා. හොඳට නිදාගත්තා. ප්‍රණීත ආහාරපාන ලැබුණ දවසට හොඳට වැළඳුවා. ඇතිපදමට වැළඳුවා. ආයෙමත් නිදාගත්තා. ගිහි ගෙවල්වල ජීවත් වෙන උදවිය දිහා බල බලා සතුටු වුණා. භාවනා කරන්න උත්සාහ ගත්තේ නෑ. ඉඳුරන් සංවර කරගත්තේ නෑ.

දිනක් පන්සියයක් ස්වාමීන් වහන්සේලා පිරිවරාගෙන බුදුරජාණන් වහන්සේ සේතව්‍ය නුවරට වැඩම කළා. සේතව්‍ය නුවර ඇට්ටේරියා වනයෙහි වැඩසිටියා. ස්වාමීන් වහන්සේලා පිඬුසිඟා වඩිද්දී මේ මහාකාල, චුල්ලකාල ස්වාමීන් වහන්සේලාව ඒ නගරයේ වැසියන් හඳුනාගත්තා. ඔවුන්ගේ නිවසට දැනුම් දුන්නා.

දිනක් චුල්ලකාල ස්වාමීන් වහන්සේට ගෙදර දානයට ඇරැයුමක් ලැබුණා. ඒ ස්වාමීන් වහන්සේ සතුටින් ගෙදරට වැඩියා. දන් වළඳා අවසානයේ ධර්මය දේශනා කළා. පින් අනුමෝදන් කොට ආපසු වැඩම කිරීම පිණිස අසුනෙන් නැගිට්ටා. එතකොට ඒ ස්වාමීන් වහන්සේගේ ගිහිකල බිරින්දෑවරුන් ඇවිදින් වට කරගත්තා.

“හා.... හා... මේ මොකද? දැන්ම ම පිටත් වෙන්නද හදන්නේ? මෙච්චර කලක් මුන්දැලාට මොකද වුණේ කියල සොයාගන්නට බැරිවයි හිටියේ. දැන් ඉතින් කොහේ යන්නද? ආ... මේ සරම ගන්නවා. හා... කෝ.... ඔය සිවුර අයින් කරන එකයි ඇත්තේ”

චුල්ලකාල ස්වාමීන් වහන්සේ හොඳටම බිය වුණා. පැනල යන්න ලැබුණේ නැහැ. ඒ භාර්යාවන් උන්වහන්සේව බලෙන්ම සිවුරු හැරෙව්වා. ගිහි රෙදි හැන්දෙව්වා.

දැන් පවුලේ උදවියට හරිම සතුටුයි. මහාකාල ස්වාමීන් වහන්සේගේ ගෙදර පිරිසටත් චුල්ලකාල සිවුරු හැරීම ගැන ආරංචි වුණා. ඔවුන්ට හරි සතුටුයි.

"හරි... අපේ එක්කෙනාට කරන්න තියෙන්නෙත් ඔය ටිකම තමයි...."

ඔවුන් පසුවදාම මහාකාල ස්වාමීන් වහන්සේ සොයා ගොස් දානයට ආරාධනා කළා. ඒ ඇරැයුම පිළිගත් මහාකාල ස්වාමීන් වහන්සේ පසුවදා එම නිවසට වැඩම කළා. පිළිගැන්වූ දානය වැළඳුවා. අනුමෝදනා බණ දේශනා කළා. ආපසු වඩින්නට සිතාගෙන අසුනෙන් නැගිට්ටා. ඒ මොහොතේම මහාකාල ස්වාමීන් වහන්සේගේ ගිහිකල බිරින්දෑවරු සඟවාගෙන සිටි ගිහි ඇඳුම් අතට ගෙන උන්වහන්සේව වට කරගත්තා.

"හා... හා... ආපසු වඩින්න වගේ. ඒවා කොහේද... දැන් ඉතින් මේ වතුපිටි බලාගෙන මල්ලිත් එක්ක වෙළහෙළඳාම් කරගෙන ඉන්න එකයි ඇත්තේ...."

මහාකාල ස්වාමීන් වහන්සේ නිශ්ශබ්ද වුණා. දෑස පියාගත්තා. කෙමෙන් කෙමෙන් පොළොවෙන් උඩට ඉස්සුණා. බිරින්දෑවරුන් පස්සට වීසි වුණා. ඇස් ලොකු වුණා. පුදුමෙන් වගේ බලාගෙන හිටියා. මහාකාල ස්වාමීන් වහන්සේ පොළොවෙන් උඩට නැඟී අහසින් වැඩියා. සියලු දෙනා වැඳගෙන ඒ දෙස බලා සිටියා. උන්වහන්සේ නොපෙනී ගියා. බිරින්දෑවරුන් එකිනෙකා බිරාන්ත වෙලා මූණට මූණ බලාගත්තා.

මහාකාල ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේට වන්දනා කළා.

"ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, අපගේ සහෝදර ස්වාමීන් වහන්සේව බලෙන් සිවුරු හරවා ගත්තා" කියා පවසා සිටියා. එවේලෙහි

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මේ ගාථා දෙක වදාළා.

- **සුභානුපස්සිං විහරන්තං**
  **- ඉන්ද්‍රියේසු අසංවුතං**
  **භෝජනම්හි අමත්තඤ්ඤුං**
  **- කුසීතං හීනවීරියං**
  **තං වේ පසහති මාරෝ**
  **- වාතෝ රුක්ඛංව දුබ්බලං**
  සංවර ඉඳුරන් නොමැතිව
  - ලස්සන දෙය ගැන රැවටී
  ගන්නා ආහාරය ගැන
  - අරුත් නොදැන එහි ගිජු වී
  භාවනාව ගැන නොසිතා
  - කම්මැලි ලෙස කල් ගෙවනා
  කෙනා නිතර වැටෙන්නේම
  - දුකින් පිරුණු ලෝකයටය
  හමනා විට තදින් සුළඟ
  - කඩා වැටෙයි දුර්වල ගස
  මාරයා දමයි ඔහු ඇද
  - ඉපදෙන මැරෙනා ලෝකෙට

- **අසුභානුපස්සිං විහරන්තං**
  **- ඉන්ද්‍රියේසු සුසංවුතං**
  **භෝජනම්හි ච මත්තඤ්ඤුං**
  **- සද්ධං ආරද්ධවීරියං**
  **තං වේ නප්පසහති මාරෝ**
  **- වාතෝ සේලංව පබ්බතං**
  සංවර වූ ඉඳුරන් ඇති
  - ලොවෙහි සැබෑ තතු දකිනා
  ගන්නා ආහාරය ගැන

- අරුතද හඳුනා සිටිනා
සැදැහැ සිතින් යුතුව සොඳින්
- වීරිය වඩමින් නිතරම
දහම විනය තුළ සිටිනා
- භාවනාව කරන කෙනා
යට කරන්ට බැහැ කිසිවිට
- මාරයාට ඔහුගෙ ගමන
තදින් සුළං හමා ගියද
- නොසැලේ ගල් කුල කිසි විට

පින්වතුනේ, පින්වත් දරුවනේ, ජීවිතය ජය ගන්නේ ඉතාමත් සුළු පිරිසයි. බොහෝ දෙනෙක් පරාජයට පත් වෙනවා. සාමාන්‍ය ලෝකයා මුදල් තිබීම, යානවාහන තිබීම, ඉඩකඩම් වතුපිට තිබීම, උපාධි තනතුරු තිබීම, ලොකු සමාජ තත්වයක් තිබීම, ජයග්‍රහණ හැටියට සළකනවා. එය යම්කිසි ජයග්‍රහණයක් තමයි. නමුත් ජීවිතයක ලොකුම ජයග්‍රහණය වන්නේ චතුරාර්ය සත්‍යය අවබෝධ කිරීමයි. ඒත් එය අවබෝධ කළ හැක්කේ කාටද යන්න වග දෙවෙනි ගාථාවෙන් හොඳින්ම පැහැදිලි වෙනවා.

පින්වතුනේ, පින්වත් දරුවනේ, වීරිය නැති, කාම සැපයෙහි ඇලුණු, ඉඳුරන් අසංවර තැනැත්තා මේ ලෝකයට බැඳෙන්නේ සිතාගත නොහැකි වේගයෙන්. බුදුරජාණන් වහන්සේ එය පෙන්වා වදාළේ සුළඟින් කඩා වැටෙන දුබල ගසක් ලෙසයි. මාරයා ඒ තැනැත්තාව වසඟ කරන්නේ ඔහු තුළ ඇති දුර්වලකම් පාදක කොට ගෙනයි. මාරයා යනු මේ ලෝකයෙහි පැවැත්ම හෙවත් ඇස, කන, නාසය, දිව, කය මනස යන සයෙහි පැවැත්මට අධිපති තැනැත්තායි. ඔහු පුද්ගලයෙක්. සංකල්පයක් නොවෙයි. ඔහුව පළමුව හඳුනාගත්තේ බුදුරජාණන් වහන්සේ පමණයි. ඔහු ඇස, කන, නාසය, දිව, කය, මනස යන ආයතන හයෙහි හටගන්නා කෙලෙස් තුළින් පුද්ගලයාට සසරෙන් එතෙර වීමට ඉඩ නොදීම පිණිස ලොකු බලපෑමක් කරනවා. බුදු බණ

තුළින් විතරයි එය පැහැදිලිව තේරුම් ගැනීමට පුළුවන් වන්නේ.

චතුරාර්ය සත්‍යය අවබෝධය යනු ඒ ඇස්, කන් ආදියෙන් නිදහස් වීමයි. එසේ ජීවිතාවබෝධය තුළින් තණ්හාවෙන් නිදහස් වීම ගැන මාරයා කැමති නැත. ඔහු නිතරම කැමති වන්නේ පුද්ගලයා ඇස, කන, නාසය, දිව, කය, මනස යන හයට බැඳී සිටීම ගැනයි. ඒ නිසා හත්වෙනි ගාථාවෙහි සඳහන් දුර්වලතාවලින් හෙබි පුද්ගලයාව එයට බැඳ තැබීම සුළු දෙයකි. ඔහු වහා එයට හසු වෙයි.

පින්වතුනේ, පින්වත් දරුවනේ, රහතන් වහන්සේගේ ස්වභාවය කොතරම් අසිරිමත්ද! උන්වහන්සේ කිසිවකට නොඇලෙයි. උන්වහන්සේ අසුභ දෙය ඒ අයුරින්ම දකිනවා. ඉඳුරන් සංවර කරගෙනයි සිටින්නේ. ලොවෙහි ඇති සියලු රස එකට කැටි කොට රහතන් වහන්සේට පිදුවත් රස තෘෂ්ණාවට උන්වහන්සේ කිසිදා හසුවන්නේ නෑ. උන්වහන්සේ වැඩ සිටින්නේ තෘෂ්ණාවෙන් නිදහස් වූ කෙනෙක් හැටියට මිස තෘෂ්ණාවෙහි දාසයෙක් ලෙස නොවෙයි. ඒ රහතන් වහන්සේගේ වීරිය හැම මොහොතේම පවතිනවා. සිහි නුවණ මැනැවින් පවතිනවා. මාරයාට කිසිසේත්ම උන්වහන්සේව තම පාලනයට ගන්නට බැහැ. ඇස, කන, නාසය, දිව, කය, මනස යන හයෙන් නිදහස් වූ උන්වහන්සේ වැඩසිටින්නේ මහා ගල් පර්වතයක් වගේ. කොතරම් සුළඟ හැමුවද එය සොලවාලන්නට කාටවත්ම බැහැ. මාරයා කවර දෙයක් කළද රහතන් වහන්සේව වෙනස් කරන්නට බැහැ. පිරිසිදු සිත් ඇති රහතන් වහන්සේලා බිහි වන්නේ බුදු සසුනක පමණයි. බුදුවරුන්ගේ ලෝකයෙහි බබලන්නේ රහතන් වහන්සේලායි.



# සෙනෙහෙබර ආමන්ත්‍රණය

# ආදරණීය දුවේ... පුතේ...

දයාබර දරුවනි, ජීවිතය යහපත් කරගැනීමට, සුන්දර කර ගැනීමට ඔබ දරන උත්සාහයට මහත් අස්වැසිල්ලක් ගෙන දෙන දයාබර කැපකරු දෙමාපියන් ඔබ වෙනුවෙන් එවූ තවත් සටහනක්...

*නමෝ බුද්ධාය !*

*ආදරණීය දියණියනි,*

*ඔයා එවන ලද ලිපිය ශ්‍රද්ධා මාධ්‍ය ජාලයෙන් මා වෙත එවා තිබුණා. ඔබටත් ඔබේ පවුලේ අයටත් නිදුක් නිරෝගී වාසනාවන්ත වසරක් වේවා යි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.*

*ඉතින් ඔබගේ ලිපිය කියවා මම ඉමහත් සතුටට පත් වුනෙමි. ඒ ගියවර විභාග යට වඩා ස්ථාන 10ක් ඉදිරියට පැමිණීම ගැනයි. ඉතින් එයට තෲාගයක් ලෙස සපත්තු දෙකක් ලබා දීමට මා තීරණය කළා. ඊළඟ වාර විභාගයේදී මීටත් වඩා හොඳ ලකුණු ලබා ගැනීමට උත්සාහවන්ත වෙන්න.*

*මහමෙව්නාවේ පින්වත් ලොකු ස්වාමීන් වහන්සේ හා අනිත් පින්වත් ස්වාමීන් වහන්සේලා මේ විදියට කරගෙන යන ශිෂ්‍යත්ව වැඩ සටහන හරිම ආදර්ශමත් විදියට ආරක්ෂාකාරී ලෙස සකස් කරල තියෙන්නේ ඔයාලගේම හොඳටයි. නමින් අඳුන නොගත්තත් කතා නොකළත් සැමදාම අපගේ ආශිර්වාදය ඔබට නොමඳව ලැබෙනවා.*

*ඉතින් ඔයා අධ්‍යාපනයේ ඉහළට වගේම ගුණ ධර්මත් හොඳින් වඩා ගන්න. බුද්ධිමත් වුවත් උගත් වුවත් ගුණවන්ත නැත්නම් ඒ තැනැත්තාගේ ගෙදරටවත් රටටවත් සමාජයටවත් වැඩක් සිදුවන්නේ නෑ. ගුණයෙන් පිරිපුන් දරුවෙක් වුනොත් ඒ උගත්කමත් ගුණයෙන් බබලවන්න පුළුවන්.*

දුවේ ඔයාගේ තාත්තා නැතිවෙලා කියලා තිබුණා. තාත්තත් නැතිව ඔයාව බලාගන්න අම්මාගේ හිත රිදවන්න එපා. ඔයා හොඳින් ඉගෙන ගෙන අම්මාව බලාගන්න. අම්මට ධර්ම මාර්ගයේ යන්න උදව් කරන්න.

මේ සමග ඔයාට සපත්තු දෙකක් හා ඇඳුම් රෙදි කිහිපයක් එවා ඇති. ඇඳුම් රෙදි වලින් ඇඳුම් මස්සවා ගන්න.

තෙරුවන් සරණයි !

මෙයට,
කැපකරු අම්මා.

නමෝ බුද්ධාය !

පින්වත් දියණිය,

ඔබ විසින් එවන ලද ලිපිය ලැබුණා. එහෙත් පිළිතුරු පමා වුනේ මා ටිකක් අසනීපයෙන් සිටි නිසායි. ඔබගේ විභාග ප්‍රතිඵල ගැන මම සතුටට පත්වෙමි. සමහර විෂයන් ගැන තව ටිකක් උනන්දු විය යුතුයි.

ඔබ බෝධි පූජාව ඉතාම ලස්සනට සැලසුම් කරල ශ්‍රද්ධාවෙන් යුතුව කරලා තිබීම ගැන සතුටුවෙමි. මමත් ඒ පින් අනුමෝදන් වෙනවා. ඒ වගේම දහම් කරුණු ඉතා හොඳින් ගළපා ලියා තිබීම ගැන අපමණ සතුටු වෙමි. පින් කළොත් සැප ලැබෙන බව බුදුරජාණන් වහන්සේ දේශනා කළේ සත්‍යපක්මයි. දැන් බලන්න නැති බැරි ළමයි ඕන

තරම් ඉන්න රටේ ශිෂ්‍යත්වයක් ලැබුනේ ඔයා සසරේ කරන ලද පිනකට. ඔයා කාටහරි උදව් උපකාර කරල ඇති. යහපත් දේවල් වලට යහපත් ප්‍රතිඵල ලැබෙනවාමයි. අයහපත් දේවල්වලට අයහපත් ප්‍රතිඵල ලැබෙනවාමයි. වරදක් වුණාම සමාව ඉල්ලීම නිහතමානී ගුණයක්. වරදට සමාව දීමත් ඒ වගේම උතුම් ගුණයක්.

ඔබේ ශිෂ්‍යත්වයට මුදල මගෙන් ලැබුණත් ඔබේ දෙමාපියන් දෙදෙනා ඔයාට බොහොම උපකාරයි. තාම හැම දෙයක් ගැනම ඒ දෙදෙනා සමඟ කතා කර තීරණ ගන්න. කිසිවිටෙක ඒ අයට බොරුවක් කියන්න එපා. ඔයාව රවටගන්න ඕනෑතරම් අය වටපිටාවේ ඇති. දෙමාපියන් කෙරෙහි විශ්වාසය බිඳ දමා ඒ අයට රැවටෙන්න එපා. ඔබ මිතුරු මිතුරියන් තෝරාගන්නා විට ඒ අය තුළ කෙතරම් සත්පුරුෂ ගතිගුණ තිබේදැයි සලකා බලන්න. ඔබේ දෙමාපියන් පැරණි කඩමළු ඇඳගෙන ඉන්න ගමන් එයාලා උපයාගත් මුදලින් ඔයාට ඇඳුම් අරන් දීලා ඇති. එයාලා කන්නෙ නැතිව ඔයාට කෑම ටික දීලා ඇති. හැම විටම දෙමාපියන්ගේ ගුණයම දකින්න. කිසිම විටෙක හිත රිදවන්න එපා. බොහොම පව් සිද්ධ වෙයි.

මෙම ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය ආරම්භ කළ ලොකු ස්වාමීන් වහන්සේටත්, අසපුවාසී සියලුම ස්වාමීන් වහන්සේලාටත් ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේ සියලුම දෙනාටත් ඔබ පවුලේ සියලුම දෙනාටත් උතුම් තෙරුවනේ ආශිර්වාදයෙන් සියලු කටයුතු සාර්ථක වේවා. සියලු දෙනාටම ධර්ම මාර්ගය දියුණු කරගැනීමට මා රැස්කරගත් පුණ්‍යධර්මයන්ද අනුමෝදන් කරමි.

මෙයට,
කැපකරු මෑණියන්.

# ආදරණීය අම්මේ... තාත්තේ...

මේ ඔබෙන් ලද මහගු දායාදයට කෘතගුණ එක්වූ තවත් සෙනෙහෙවන්ත සටහනක්...

*නමෝ බුද්ධාය !*

*දයාබර කැපකරු මාපියන් වෙත,*

*නිබඳ මා හට දිරියක් වෙමින් මා සමීපයේ රැඳෙමින් මාගේ අධ්‍යාපන ජීවිතය සාර්ථක කරගැනීමට උපකාරී වන මා ආදරණීය කැපකරු මාපියන් සුවයෙන් ඇතැයි මම සිතමි. සෑම මසකම ඔබ විසින් නොමසුරුව මා හට ලබා දෙන ශිෂ්‍යත්ව මුදලට බෙහෙවින් කෘතඥ වෙමි. එය මාගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීමට මනා පිටුවහලක් විය.*


*පසුගිය වාර විභාගයෙන් මා හට තර්ක ශාස්ත්‍රය විෂයය සඳහා ලකුණු 82 ක් ලබා ගනිමින් වැඩිම ලකුණු ලබා ගැනීමටත් ත්‍යාග ප්‍රදානෝත්සවයේ ඒ සඳහා ත්‍යාගයකට හිමිකම් ලැබීමටත් මම සමත් වුනෙමි. ඒක මාගේ විශාල ජයග්‍රහණයක් වූ අතර මාගේ අරමුණ මීළඟ වාරයේදී මෙම ලකුණු තව තවත් වර්ධනය කර ගනිමින් අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා විශිෂ්ට ලෙස මුහුන දී A3 ක් ලබා ගැනීමයි.*

*මෙම මස මා හට ලැබුණු දහම් පොතේ සඳහන් පරිදි වීර්යයෙන් කටයුතු කර මා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබාගැනීම මාගේ අරමුණයි. මෙම මා ලද ශිෂ්‍යත්ව මුදල වියදම් කළ අන්දම මෙසේය. සිංහල පංතිය සඳහා රු. 1000 කුත්, තර්ක ශාස්ත්‍රය අමතර පන්තිය සඳහා රු 100 කුත්, විභාග කොළ මිටියක් ලබා ගැනීමට*

රු. 180 කුත්, මව සඳහා රු. 200 කුත්, බෞද්ධ සංගමයේ නිල ලාංඡනය ලබා ගැනීමට රු. 275 කුත් වැය  කළෙමි. ඉතිරි මුදල පන්සලෙහි විදුලි බිල සඳහා ආධාර වශයෙනුත් පරිත්‍යාග කළෙමි. නිබඳ මා හට දිරියක් වන ඔබ දෙපළට නිරෝගීමත් හා ප්‍රීතිමත් දිවියක් පතමින් මා මෙතනින් නවතින්නම්.

බුදු සරණයි !

මෙයට කැපකරු දියණිය.



# අපණ්ණක ජාතකය

නිදොස් මාර්ගය ගැන කථාව

පින්වතුනේ, පින්වත් දරුවනේ,

ඔබ අනේපිඬු මහාසිටාණන් ගැන දන්නවා ඇති. ඔහු ඉතා ධනවත් ව්‍යාපාරිකයෙක්. සෝවාන් ඵලයට පත්ව සිටි මහා සැදැහැවතෙක්. ඔහු සැවැත් නුවර ජේත කුමාරයා සතුව තිබුනු ඉතාම ලස්සන උද්‍යානයක් කහවණු අතුරලා මිලට ගත්තා. කුටි සෙනසුන්, පැන් පොකුණු, සක්මන්මළු, ගිනිහල් ගෙවල්, දම්සභා මණ්ඩප, සුගන්ධ කුටි ආදියෙන් සම්පූර්ණ කරවලා 'ජේතවනය' නමින් භාග්‍යවතුන් වහන්සේට මහා ආරාම පූජාවක් කළා.

මේ අනේපිඬු මහා සිටුවරයාට යහළුවන් ගොඩාක් ඉන්නවා. ඔවුනුත් නොයෙක් ව්‍යාපාර කරන අය. හැබැයි ඔවුන් තෙරුවන් සරණ ගිය උපාසකවරු නොවෙයි. අන්‍ය තීර්ථක ශ්‍රාවකයන්. දවසක් අනේපිඬු මහසිටාණන් ඔවුන්ට කතා කළා.

"යහළුවනේ.... මෙවර නම් මගේ ඉල්ලීම ඉටුකරන්න ඕන. අපි භාග්‍යවතුන් වහන්සේව බැහැදකින්න යමු. මං ඔයාල ඔක්කොම වෙනුවෙන් මල්, සුවඳ, සිවුරු පිරිකර සූදානම් කරල තියෙන්නෙ."

ඉතින් ඒ පන්සියයක් වූ යහළුවන් පිරිවරා ගත් අනේපිඬු සිටුතුමා භාග්‍යවතුන් වහන්සේව බැහැදකින්න ගියා. පුද පූජා පැවැත්තුවා. භික්ෂු සංඝයාටත් පුද පූජා පැවැත්තුවා. ඔවුන්ටත් භාග්‍යවතුන් වහන්සේගෙන් ධර්මය අසන්ට ලැබුනා. ගැඹුරට තේරුනේ නැතත් සිත පැහැදුනා. අන්‍යතීර්ථක සරණ අත්හැරියා. බුදුන් සරණ ගියා. ඔවුන් එදා පටන් අනේපිඬු සිටුතුමා සමඟ නිතර දෙව්රමට යනවා. බණත් අහනවා. දානයත් දෙනවා. සිලුත් සමාදන් වෙනවා.

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරින් නික්මිලා චාරිකාවේ වැඩියා. රජගහනුවරට වැඩියා. එතකොට අනේපිඬු සිටුතුමාගේ ව්‍යාපාරික යාළුවෝ එක්කෙනා දෙන්නා දෙව්රමට එන එක අඩු කළා.

ටික දවසක් යද්දී හැමෝම පරණ තැනමයි. ආයෙමත් පරණ තීර්ථක ආරාමයට ගියා. අන්‍යතීර්ථකයන් සරණ ගියා. තිසරණ බිඳගත්තා.

භාග්‍යවතුන් වහන්සේ ආයෙමත් සැවැත්නුවර වැඩියා. එතකොට අර යාළුවෝ පන්සිය දෙනා අනේපිඬු සිටුතුමා සමඟ ආයෙමත් භාග්‍යවතුන් වහන්සේ බැහැදකින්න ගියා. තිසරණය සරණ ගියා. අන්‍ය තීර්ථක සරණ අත්හැරියා. එතකොට අනේපිඬු සිටුතුමා භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළා.

"අනේ... ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, අපේ මේ යහළුවන්ට හරි වැඩක් නොවැ වුනේ. භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටිනකල් විතරයි උනන්දුව තිබුනේ. එතකම් විතරයි තිසරණ පිහිටා සිටියේ. එතකම් බණත් අහන්න ආවා. දානෙත් දුන්නා. සිලුත් ගත්තා. භාග්‍යවතුන් වහන්සේ චාරිකාවේ වැඩිය ගමන් මෙයාලාට මොනවා උනාද මන්දා....! කවුරුවත් ආවේ නෑ. ටික දවසකින් මට දැනගන්ට ලැබුනා. උතුම් තිසරණෙත් බිඳගෙන. ආයෙමත් පරණ වලේ වැටිලා. අන්‍ය තීර්ථකයන් සරණ ගොහින්."

එතකොට ඒ උපාසකවරු පන්සිය දෙනා මහත් ලැජ්ජාවෙන් බිම බලාගෙන සිටියා. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ගෙන් විමසා වදාළා.

"හැබෑද උපාසකවරුනේ...... තිසරණ බිඳ ගත්තා ද? ආයෙමත් අන්‍ය තීර්ථකයන් සරණ ගියා ද...?"

"එහෙමයි ස්වාමීනී.... අපෙන් ඒ වරද වුනා."

"උපාසකවරුනේ.... ඔබට තථාගතයන්ව හඳුනාගන්ට නොහැකි වීම නිසයි ඒක වුනේ. ධර්මයත් හඳුනාගන්ට බැරි වුනා. ශ්‍රාවක සංඝයාවත් හඳුනාගන්ට බැරි වුනා. සතර අපා දුකින් මුදවන්ට මේ තිසරණයට පුළුවනි. දෙව්ලොව උපදවා මහා දෙව්සැප

ලබාදෙන්ටත් පුළුවනි. සසරින් එතෙර කරවන්ටත් පුළුවනි. මෙබඳු වූ තුන් සරණ බිඳ ගැනීම ඔබට වූ විශාල පාඩුවක්. මහා බරපතල පාඩුවක්.

උපාසකවරුනේ.... ඉස්සර මිනිස්සු සරණක් නැති අමනුස්සයන් ගේ වංචනික බහට රැවටිලා වැරදි මග ගියා. මහා කාන්තාරේ අතරමං වුනා. අමනුෂ්‍යයන්ට බිලි වුනා. මහා විනාශයකට පත් වුනා. නමුත් බුද්ධිමත් මිනිස්සු ඉස්සරත් බේරුනා. ඔවුන් නිවැරදි මග ගත්තා. ඒ කාන්තාරයම සුවසේ තරණය කළා."

එතකොට අනේපිඬු සිටුතුමා හුනස්නෙන් නැගිට්ටා. භාග්‍යවතුන් වහන්සේට දොහොත් නගා වන්දනා කරගත්තා. මෙහෙම කිව්වා.

"ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, අපගේ යහළුවන් වූ මේ උපාසකවරුන් තිසරණය බිඳගෙන වැරදි පිළිසරණක් සෙවූ මේ කථාව නම් ප්‍රකටයි. නමුත් භාග්‍යවතුන් වහන්සේ වදාළ ඒ අතීත කාලේ අමනුස්සයන්ට රැවටී විපතට පත් මිනිසුන් ගැනත්, නිදොස් මග ගමන් කොට සුවපත් වූ මිනිසුන් ගැනත් විස්තරේ අපි කාටවත් ප්‍රකට කථාවක් නොවෙයි. ස්වාමීනී.... ඒ කතාව අපට වදාරණ සේක්වා!" එතකොට භාග්‍යවතුන් වහන්සේ අතීතයෙන් වැසී ගිය ඒ අපූරු කථාව මෙසේ වදාළා.

"ගෘහපතිය... ඒක මෙහෙමයි වුනේ. ගොඩාක් ඉස්සර කාලෙක කසී රට බරණැස් නුවර බ්‍රහ්මදත්ත නමින් රජෙක් හිටියා. ඒ කාලෙ බෝධිසත්වයෝ උපන්නේ ගැල්වෙළඳාමේ යන පවුලක. ඉතින් බෝධිසත්වයොත් තරුණ වයසට පත් වෙලා ඒ ගැල්වෙළඳාම සරුවට කළා. ගැල් පන්සියයක් අරගෙනයි වෙළඳාම් කළේ. කලකට නැගෙනහිර පැත්තට යනවා. කලකට බටහිර කාන්තාර පැත්තට යනවා.

ඔය අතරේ බරණැස ම තවත් ගැල්වෙළඳාම් කරුවෙක් හිටියා. හැබැයි ඔහු මෝඩයි. නුවණින් වැඩ කරන්න දන්නෙ නැහැ. ඔහු තරඟයට වගෙයි වෙළඳාම් කළේ.

දවසක් බෝධිසත්වයෝ ගැල් පන්සියයක වටිනා බඩු පිරෙව්වා. බටහිර පැත්තට වෙළඳාමේ යන්ට සූදානම් වුනා. එතකොට අර මෝඩ ගැල් වෙළෙන්දාත් තමන්ගේ ගැල් පන්සියය සූදානම් කරගත්තා. ඔහුත් බටහිර පැත්තටයි යන්න හදන්නේ. එතකොට බෝධිසත්වයෝ මෙහෙම සිතුවා.

"දැන් මේ ගැල් වෙළෙන්දත් මා සමඟ ම යන්ට ආවොත් අපි දෙගොල්ලම අමාරුවේ වැටෙනවා. ගවයන්ටත් තණකොළ නැතිවෙනවා. ඒ නිසා දෙන්නා ගෙන් එක්කෙනෙක් ඉස්සෙල්ලා යන්ට ඕනා. අනිත් කෙනා පස්සෙ යන්ට ඕනා" ඉතින් බෝසත් ගැල් වෙළෙන්දා අර වෙළෙන්දාට කතා කළා.

"මේ... මිත්‍රයා... අපි දෙන්නාම එක්වරම වෙළඳාමට යන එක දෙන්නාටම කරදරයක්. ඒ නිසා අපි කවුරු හරි ඉස්සර වෙමු. දැන් එතකොට කලින්ම යන්නෙ ඔබ ද? මම ද?"

එතකොට මෝඩ ගැල්වෙළෙන්ඳා මෙහෙම සිතුවා. "මං කලින් ගියොත් වාසි ගොඩක් තියෙනවා. ගවයන්ට තණ තියෙනවා. අපට ව්‍යංජන වලට පලාවර්ග ලැබෙනවා. ජල පහසුව ලැබෙනවා. බඩුත් විකුණගන්ට ලැබෙනවා" කියලා.

"එහෙනම් යහළුවා.... මං ඉස්සර වෙලා යන්නම්" කියලා ඔහු වේලාසනින් පිටත් වුනා.

එතකොට බෝධිසත්වයෝ මෙහෙමයි සිතුවේ. "ඒකත් හොඳා.... පස්සෙ පිටත් වෙන මගේ ගවයන්ට කලින් ගවයන් කෑ තැනින් නැගී අලුත් තණ කන්ට පුළුවනි. අලුත් පලා දළු අපට උයන්ට ගන්ටත්

පුළුවනි. එයාල අලුතින් හදන ජලපහසුකම් වලින් අපට ප්‍රයෝජන ගන්ටත් පුළුවනි. ඔවුන් කලින් විකුණූ බඩු මිලට ම බඩු විකුණාග න්ටත් පුළුවනි" කියලා.

ඉතින් අර මෝඩපහේ ගැල්වෙළෙන්ඳා ඉතා සතුටින් ගැල් පිරිවර ගෙන පිටත් වුනා. කාන්තාර ප්‍රදේශයටත් ආවා. ඒක නිරුදක කතරක්. පේනතෙක් මානෙ වැලි. තද අව්වට වැල්ල කැකෑරෙනවා. ගිනි රස්නෙ. දිය බිඳක් පේන තෙක් මානෙ නෑ. කෑම් බීම් කිසිවක් නෑ. ඔය නිරුදක කතරේ හරියට අමනුස්සයෝ ඉන්නවා. ඔවුන් ගැල්කරුවන්ව මුළා කරවනවා. බිලි ගන්නවා. ඒ කාන්තාරය යොදුන් හැටක් තරණය කරන්න තියෙනවා. ඔය බිහිසුනු වැලි කතරටයි දැන් ගැල් පන්සියය බැසගත්තේ.

අමනුස්සයන් මොවුන්ව දැක්කා. කාන්තාරයේ මැදට එනකල් සිටියා. ලස්සන තරුණ සුදු ගවයන් යෙදූ කරත්ත මවා ගත්තා. දිය බේරෙන මහනෙල් මල් මාලා පැළඳගත්තා. ලස්සන මිනිසුන්ගේ වෙස් ගත්තා. ඔවුන් ගේ වස්ත්‍රත් තෙතයි. කොණ්ඩෙනුත් දිය බේරෙනවා. මේ දැන් පැන් පොකුණකින් ගොඩට ආවා වගෙයි. කරත්ත රෝද වලත් මඩ තැවරිලා. ඔවුන් සිනාසෙමින් සිංදු කිය කියා නෙළුම් අල කකා ඒ කරත්ත වලින් ඉදිරියට එනවා.

ප්‍රධාන ගැල් නායකයා තමයි සියලු වගකීම් දැරිය යුත්තේ. ඉදිරියෙන් සුළඟ හමද්දී ඔහු පිරිස් පිරිවරා ගෙන දූහුවිලි වළක්වමින් ඉදිරියෙන් යනවා. පසුපසින් සුළඟ හමද්දී ඔහු පසුපසින් යනවා. එදා ඉදිරිපසින් සුළඟ හැමුවේ. ඒ නිසා ඔහු ඉදිරියෙන් ගියා.

දැන් මේ ගැල් නායකයා ඉදිරියෙන් එද්දී අමනුස්සයෙක් තමන්ගේ කරත්තේ මගින් බැහැර කොට නැවැත්තුවා.

"හා...... ඔහේලා කොයිදෑ මේ යන්නේ.....?" එතකොට ප්‍රධාන ගැල් නායකයා තමන්ගේ ගැලත් නැවැත්තුවා. අනිත් ගැල් වලට

යන්න ඉඩ දීලා ඔවුන් සමග කතා කළා.

"මිත්‍රවරුනි.... අපි බරණැස ඉඳලා එන ගමන්. ඔහේලා හොඳට වතුර නාලා..... මහනෙල් මල් පැළඳගෙන.... තෙත් වස්ත්‍ර ඇතිව..... අලුත් නෙළුම් අල කකා..... කොහේ ඉඳන් ද මේ එන්නේ. ඔහේලා එන පාරේ නෙළුම් පිපුනු විලක් තියෙනවා ද?"

"මොනවා අහනවද ඕයි..... තව ටික දුරක් යද්දී ඝන නිල් වනාන්තරේ. දිය ඇලි ගලනවා. වැව් පොකුණු පිරිලා. අපි එහෙ ඉඳලා එන ගමන්. ඔහේලා යන්නේ කොයි පළාතට ද....?"

"මිත්‍රයා, අපි යන්නේ අසවල් පළාතටයි."

"මොනවද මේ ඔය හැටි බඩු...?"

"අපි රෙදි වර්ග, වලං වර්ග, සෙල්ලම් බඩු වගේ දේවල් තමයි මේ ගෙනියන්නේ."

"එතකොට අර පිටිපස්සෙන් මහාබරට අදින්නේ මොනවා ද?"

"ආ.... ඒ වතුර ගැල්..... කාන්තාරයේ යද්දී ජලය නැහැ නොවැ. ඒ භාජන පුරවලා තියෙන්නේ වතුර."

"අනේ මිත්‍රයා...... මෙතෙක් දුර ඔහේලා ඔය වතුර බරක් ගෙනා එකත් හොඳා. නමුත් මෙතැනින් එහාට වතුර වැඩක් නෑ. මේ පේන්නෙ නැද්ද අපි හොඳට වතුර නාලා එන හැටි. අනේ ඕවා හලාදමන්න. ගවයන්ටත් හෑල්ලුයි. බරත් අඩුයි. ගමනත් පහසුයි. මොනවට කරදර වෙනවා ද...... කොහොමත් මේ වතාවෙ වැස්ස ගොඩාක් වැඩියි..... එහෙනම් අපි යනවෝ....." කියලා ඒ අමනුස්ස කරත්ත ඈතට ගියා. නොපෙනී ගියා.

මෝඩ ගැල් නායකයා අමනුස්සයන්ගේ වංචාවට හසුවුනා. දිය හැලි ඔක්කොම බිම හැලුවා. හෑල්ලුවෙන් ගමන පිටත් වුනා. දිගින් දිගටම ලස්සන වනය බලාපොරොත්තු වුනා. මහනෙල් පිපුනු පැන් පොකුණු දකින්න ආසා කළා. අහෝ..... ජේනතෙක් මානෙ කැකෑරෙන වැල්ල විතරයි. පිපාසයට දිය බිඳක් මිනිසුන්ටත් නෑ. ගවයන්ටත් නෑ. හවස් වෙද්දී හැමෝගේ ම උගුර කට වේලී ගියා. ගවයන් පිපාසයෙන් සෙම හලන්න පටන් ගත්තා. මිනිසුන්ට කලන්තෙ හැදුනා. කරන්ට දෙයක් නෑ. දැන් රෑ බෝ වෙන්ට පටන් ගත්තා. ගැල් පන්සියය රවුමට ගාල් කළා. ගැල් නායකයා හූල්ල හූල්ල ඉන්නවා. දුර්වල මිනිස්සු වැටුනු වැටුනු තැන නිදාගත්තා. මහ රෑ අමනුස්සයන් ආවා. සියලු ගොනුන්වත් සියලු මිනිසුන්වත් මැරුවා. ඔවුන්ගේ ලේ බිව්වා. මසුත් කෑවා. ඇට විතරක් ඉතුරු කළා.

බෝධිසත්වයොත් මාසෙකට හමාරකට පස්සෙ ගැල් ගමනට පිටත් වුනා. අර කාන්තාරයටම පැමිණුනා. ඔහු තම සේවකයන් ඇමතුවා.

"මිත්‍රවරුනි........ දැන් අපි මේ පිවිසෙන්නේ යොදුන් සැටක කාන්තාර ගමනටයි..... හොඳින් මතක තියාගන්න. මට නොකියා වතුර බිඳුවක් අහක දාන්න එපා..... මේ කාන්තාරේ විෂ පලා වර්ග තියෙනවා. විෂ ගෙඩි වර්ග තියෙනවා. මට නොකියා ඒ කිසිම දෙයක් කෑමට ගන්න එපා" කියලා.

මේ ගැල් පිරිසත් කාන්තාරයේ මැදට යනකල් අමනුස්සයන් බලා හිටියා. කලින් වගේම ලස්සන සුදු ගවයන් යෙදූ කරත්ත මවාගෙන කලින් වගේම තෙත බරිත වෙලා, මල් මාලා පැළඳගෙන, නෙළුම් අල කකා හිනැහීගෙන ආවා. කලින් වගේම බෝසතුන් සමඟත් කතාවට වැටුනා. කලින් විස්තරේම කිව්වා. ඈතට ගිහින් නොපෙනී ගියා.

එතකොට ගැල් පිරිස බෝධිසත්වයන්ට මෙහෙම කිව්වා.

“ආර්ය පුත්‍රය..... දැක්ක නේ.... අර මිනිස්සු නෙළුම් අල කකා සිංදු කිය කිය ගිය හැටි..... ඉස්සරහ ඝන නිල් වනාන්තරේ ලු. ඉතින් අපි මොකට ද මේ අනවශ්‍ය වතුර බරක් අරගෙන යන්නේ. ගවයින්ටත් අමාරුයි. ඒ නිසා අපි වතුර බර හිස් කරමු. පහසුවෙන් යමුකෝ.”

එතකොට බෝධිසත්වයෝ ගැල් ගමන නැවැත්තුවා. ගැලේ සිටිය සියලු පිරිස රැස්කළා.

“මිත්‍රවරුනි.... ඔබ කවදාවත් අහලවත් තියෙනවාද මේ කාන්තාරේ වනාන්තර වැව් පොකුණු තියෙන බව....?”

“නෑ ආර්ය පුත්‍රය..... ඒ උනාට ඒ මිනිස්සු කිව්වෙ ඉස්සරහ වනාන්තරේලු. මහා වැසි වසිනවාලු.”

“හොඳයි.... එහෙම වැසි වසිනවා නම් සීතල සුළඟ කොතෙක් දුරට හමනවා ද...?”

“ආර්ය පුත්‍රය.... යොදුනක් දුරට හමනවා.”

“හොඳයි.... එහෙනම් ඔය එක්කෙනෙකුගේ වත් ඇඟට සිහිල් සුළඟ මාත්‍රයක් වත් වැදුනා ද....?” “නෑ ආර්ය පුත්‍රය.”

“හරි.... එහෙම මහවැසි වසිනවා නම් ඒ වළාකුලු කොතෙක් දුරට පේනවා ද?” ”යොදුනක් දුරට පේනවා.”

“හරි... එහෙමනම් එක්කෙනෙක් වත් වැහි වළාවක් දැක්කා ද?” “නෑ ආර්ය පුත්‍රය.”

“හරි.... විදුලි කොටද්දී කොතෙක් දුරට පේනවා ද?” “යොදුන් පහක් දුරට පේනවා” “හොඳයි.... විදුලි කොටනවා කවුරුවත් දැක්කාද?”

"නෑ ආර්ය පුත්‍රය."

"හරි..... අහස ගොරවන සද්දේ කොතෙක් දුරට ඇහෙනවා ද?" "යොදුනක් දෙකක් දුරට ඇහෙනවා."

"හරි.... කාටවත් ඇහුනා ද?" "නෑ ආර්ය පුත්‍රය."

"මිත්‍රවරුනි.... ඒ මිනිස්සු නොවෙයි. ඔවුන් අමනුස්සයෝ. ඔවුන් බොරු කිව්වේ. මං ඒ අමනුස්සයන් එක්ක කතා කරද්දී හොඳ කල්පනාවෙන් හිටියේ. ඔවුන් කවුරුවත් ඇසි පිය හෙළන්නේ නෑ..... ඔවුන්ගේ සෙවනැල්ලත් නෑ. ඒ කරත්තවලවත්, ගවයන්ගේ වත් හෙවනැලි නෑ. ඔවුන් මායාවක් පෙන්නුවා. වංචාවක් කළේ..... අපිව මුළා කරවලා, අපේ වතුර අපි ලවාම බිමට හලවලා, කලන්තෙ හදවලා, අපව මරා කන්නයි ඔවුන්ගේ සැලැස්ම...... මං මේ කල්පනා කරන්නේ..... මට හිතෙන හැටියට කලින් ආපු ගැල් පිරිස මේ අමනුස්සයන්ගේ ගැටේට හසුවෙන්න ඉඩ තියෙනවා. මොවුන්ගේ මායාව හඳුනාගන්න එක ලේසි නෑ..... දැන් මිත්‍රවරුනි.... හොඳට මතක තියාගන්න..... එක දිය බිංදුවක් අහක දාන්න එපා.... අපි ඉක්මන් කරලා අපේ ගමන යමු."

බෝධිසත්වයන්ගේ ගැල් පන්සියය සවස් වෙද්දී කලින් ගැල් නැවැත්තූ තැනටම ආවා. අහෝ.... සියලු දෙනා අමනුස්සයන්ට ගොදුරු වෙලා. හැම තැන ඇටකටු විසිරිලා තියෙනවා. බෝධිසත්වයන් වේලාසනින්ම ගැල් ගාල් කෙරෙව්වා. මිනිසුන්ටත් ගවයන්ටත් ඉක්මනින් කෑම දුන්නා. මිනිසුන්ගේ මැද්දට ගොනුන්ව ගාල් කෙරෙව්වා. ගැලේ සිටිය බල නායකයන්ගේ අතට කඩු දුන්නා. රාත්‍රිය පුරා සිටගෙනම ගැල් පිරිවර මුර කළා. බෝධිසත්වයෝත් එළිවෙන කල්ම ගැල වටේ ඇවිදිමින් සිටියා. පසුවදා ගවයන්ටත් මිනිසුන්ටත් කෑම දුන්නා. තමන්ගේ දුර්වල කරත්ත අත්හැරියා. එතැන තිබුන ශක්තිමත් කරත්ත ගත්තා. තමන්ගේ ලාභ බඩු අත්හැරියා. එතැන තිබුන වටිනා බඩු පුරවා ගත්තා. කාන්තාර ගමන ඉක්මනින් අවසන්

කළා. හොඳින් වෙළඳාම් කරගත්තා. නැවත සුවසේ බරණැසට ආවා.

මෙසේ වදාළ භාග්‍යවතුන් වහන්සේ අනේපිඬු සිටු අමතා මෙසේත් වදාළා.

"ගෘහපතිය.... දැක්ක නේ.... ඉස්සර හරි දේ සිතා ගන්න බැරි අය මහා විනාසයකට පත් වුන හැටි. නිවැරදි ලෙස සිතපු අය අමනුස්ස ග්‍රහණයෙනුත් මිදුනා. තමන්ගේ ගමනත් ගියා. සුවසේ නැවතත් සිටි තැනටම ආවා.

අනුන් කියන දේ නොසොයා නොබලා ඒ විදිහටම ගත්ත අය අමනුස්සයන්ට හසුවෙනකල්ම දන්නෙ නෑ. තර්ක කර කර හිටියා. පිටතින් පේන දේ හරි කියල හිතුවා. නමුත් සත්‍ය තත්වය ඊට හාත්පසින්ම වෙනස්. බෝධිසත්වයන්ගේ බසට අවනත වූ නිසා අනික් පිරිස බේරුනා. ඒ ප්‍රතිපදාවට කියන්නේ අපණ්ණක ප්‍රතිපදාව කියල. නිදොස් ප්‍රතිපදාව කියල. නිවැරදි ක්‍රමය කියල.

තථාගතයන් දියුණු කළේ ඒ අපණ්ණක ප්‍රතිපදාවයි. ඒ තුළින් සුගතියේ උපතත් සැලසුනා. මගඵල නිවනත් සැලසුනා. වැරදි ප්‍රතිපදාවට කියන්නේ සපණ්ණක ප්‍රතිපදාව කියල. ඒ තුළින් සතර අපායයි ලාමක උපතයි විතරක් ලැබෙනවා.

ගෘහපතිය.... ඒ කාලේ අර මෝඩ ගැල් නායකයා වෙලා සිටියේ දේවදත්ත. ඔහුගේ පිරිස දැන් ඉන්න දෙව්දත්ගේ පිරිසමයි. නුවණැති ගැල් නායකයා වුනේ මමයි. ඔහුගේ පිරිස වුනේ දැන් සිටින බුදු පිරිසයි."

පින්වතුනේ, පින්වත් දරුවනේ, මේ කථාව නිසා තිසරණය කියන්නේ නිදොස් ප්‍රතිපදාව කියල අර උපාසකවරුන්ට වැටහුනා. තිසරණයෙන් බැහැර ඇති පිහිට තියෙනවා කියන තැන් අර අමනුස්සයන් ගේ මායාව වගේ කියලත් අවබෝධ වුනා. භාග්‍යවතුන්

වහන්සේ ගේ උතුම් පිළිසරණ ඒ උපාසකවරුන්ට තේරුනා. ඔවුන් සියලු දෙනා සෝවාන් ඵලයට පත් වුනා. හරි දේ මුණ ගැහිලා එය අත්හැර ආයෙමත් වැරදි මගට වැටෙන අය මේ කාලෙ මොනතරම් ඉන්නවා ද?



# පුදමු මාපිය ගුරුවර වැඩිහිටි උතුමන්

නමෝ බුද්ධාය!

දයාබර දුවේ පුතේ,

බොහොම පුංචි කාලයේ ඉඳන් ම අපට නිතර ලැබුණු අවවාදයක් තමයි මේ... “අම්මට තාත්තාට ගරු කරන්න. ගුරුවරුන්ට ගරු කරන්න. වැඩිහිටියන්ට ගරු කරන්න.” අපි වගේ ම දුවලා පුතාලත් මේ අවවාදය නිතර අසා ඇති. අපිට උරුම වුණ සංස්කෘතිය තුළත් දෙමාපියන්ට ගරු කිරීම, ගුරුවර, වැඩිහිටියන්ට ගරු කිරීම හැමවිට ම ප්‍රශංසා කරනවා. ඇත්තෙන් ම අවවාදයක් ලෙසින් අපේ ජීවිතවලට මේ සමීප වී තිබෙන්නේ සත්පුරුෂ ලෝකයේ අගය කිරීමට ලක් වන දෙයක්, සුන්දර ගුණධර්මයක්.

අපි හැම දෙනා ම මේ අනුව කටයුතු කරලත් තිබෙනවා. දුටු විට හුනස්නෙන් නැගිටීමෙන්, වැඳුම් පිදුම් කිරීමෙන්, ආසන පැනවීමෙන්, ආහාරපාන පිළිගැන්වීමෙන්, කීකරු වීමෙන්, පුද සත්කාර දැක්වීමෙන් ආදී වශයෙන් අප විසින් මේ ගුණධර්මය පුරුදු පුහුණු කරනවා. දුවේ පුතේ, මුළුමහත් සමාජයක ඇගයීමට බඳුන් වන, සෑම කල්හි ම නුවණැති සත්පුරුෂයන් විසින් පසසනු ලබන ගුණයක් බවට මේ කාරණය පත් වුණේ ඇයි කියා ඔබ සිතා තිබෙනවා ද? ඇයි අප අම්මා තාත්තාට ගරු කළ යුත්තේ? ඇයි අප ගුරුවර වැඩිහිටියන්ට ගරු කළ යුත්තේ?

දුවට පුතාට මේ ගැන නොයෙක් කාරණා සිහිපත් වේවි. ඔබට නොයෙක් හේතු දක්වන්නටත් හැකි වේවි ඒ ගැන. අද අපි දුව පුතා එක්ක ඒ ගැන අදහස් හුවමාරු කර ගන්නට සිතුවා. දුවට පුතාට සිහිපත් වුණ කාරණා වගේ ම දුව පුතා නොදන්නා කාරණාත් ඉදිරියේ දී ඔබට මුණගැසේවි. කුඩා අවදියේ පටන් අප විසින් පුරුදු පුහුණු කර ගන්නට යෙදුණේ මොනතරම් වටිනා ගුණධර්මයක් ද කියා තුටුපහටු වන්නට මෙය ඔබට වගේ ම අපටත් උපකාරයක් ලෙසින් අප සලකනවා.

දුවේ පුතේ, අප උපන්න මිනිස් ලෝකය සුගති ලෝකයක්. සුගතියේ ඉපදෙන්න ලොකු පිනක් තියෙන්න ඕන. මිනිස් ලෝකයේ උපතක් ලැබිය හැකි අයුරින් මව්කුසක පිළිසිඳ ගන්නා හැමෝම නොවැරදී ම මව්කුසින් බිහි වන්නේ නැහැ; ඇතැම් කෙනෙක් මව්කුස තුළ දී ම මිය යනවා. තවත් කෙනෙක් උපතේ දී හෝ උපන් හැටියේ දී ම හෝ මිය යනවා. රටේ තොටේ වාර්තා වන දේවල දී පෙනී යන්නේ එසේ මිය යන ඇතැම් දරුවන් මව්පියන් විසින් ම මරා දැමෙන බව යි. ඒ දරුවා තමන්ට අනවශ්‍ය දරුවෙක් ලෙස සලකා උපක්‍රමයෙන් දිවි තොර කිරීම යි එහි දී සිදු කරන්නේ. දුවේ පුතේ, ඒ මරණ අතරින් ඇතැම් ඒවා අකල් මරණ. ඇතැම් ඒවා කර්ම විපාක බලවත් වීමෙන් සිදු වන මරණ. මව්කුසේ මිය යන්නට බලවත් අකුසල විපාකයන් අපි කාටවත් තිබුණේ නැහැ. අපේ රත්තරන් අම්මාත්, තාත්තාත් අප ව උවමනා නැහැ කියා සිතා උපක්‍රමයෙන් අපේ ජීවිත නසා දැමුවේ නැහැ. ඒ නිසයි අපි මිනිස් ලෝකයේ උපන්නේ.

බලන්න... මේ උපත නිසා ලැබුණ මිනිස් ජීවිතයේ අපට පුළුවනි තෝරා බේරා ගැනීම් සිදු කරන්න. දුව පුතා නිවසේ ඇති දැඩි කරන සුරතල් බල්ලන්, බළලුන් දැක තිබෙනවා නේ ද? ඔවුන් මීයන් වැනි සතුන් ව දඩයම් කරනවා. දුව පුතා දැක තිබෙනවා ද එකමෙක බළලෙක්, බල්ලෙක් මීයාගේ ලොම් ඉවත් කරලා, බඩවැල් - අසූචි ඉවත් කරලා ආහාරයට ගන්නා බවක්? නැහැ. උන්ට එවැනි තෝරා ගැනීම් සිදු කරන්නට බැහැ. ඒත් අපි... කන බොන දේ පවා පිළුණු වෙලා ද කුණු වෙලා ද රසවත් ද ප්‍රණීත ද කියා තෝරා ගන්නවා නේ ද? එළවළුවක්, පලාවක් වුණත් අප ආහාරයට ගන්නේ අපවිත්‍ර කොටස් ඉවත් කොට හොඳ කොටස ම පමණයි. ඒ ඉඩ අපට ලැබුණේ මිනිස් ලෝකයේ උපන්න නිසයි.

සතුන් විළි වසන්නේ නැහැ. එළි පිට කළ යුත්ත - නොකළ යුත්ත ගැන සතුන්ට අදහසක් නැහැ. මිනිස් ලෝකයේ ඒ දේවල් ඊට හාත්පසින් ම වෙනස්. අප විළි වැසෙන ලෙස ඇඳුම් අඳිනවා. ඒ ඒ තැන කටයුතු කළ යුතු ආකාරයන් ගැන අප තේරුම් ගන්නවා. මේ

ජීවිතයේ අපට ගුණධර්ම පුරුදු කරන්නටත් පුළුවනි. දන් දෙන්න, සිල් රකින්න, බණ භාවනා සිදු කරන්න අපට අවස්ථාවන් තිබෙනවා. ඒ ඒ ආකාරවලින් පින් රැස් කරන්නට අවස්ථාව තිබෙන නිසා ම සැප සැලසෙනවා. ඒ සැපය මේ ජීවිතයට පමණක් සීමා වෙන්නේ නැහැ. පරලොව ජීවිතය සැපවත් කර ගන්නටත්, සසර සුවපත් භාවය සලසන නිවන් අවබෝධ කිරීමටත් ඒ පින ම යි උපකාරක වන්නේ.
දුවේ පුතේ ඒ සියලු අවස්ථාවන් අපට ලැබුණේ අපේ අම්මාත්, තාත්තාත් අප ව මරා දමන්නට නොසිතූ නිසයි. මව්කුසේ හිඳිද්දී පවා විපතක් වන්නට නො දී බොහොම ආදරයෙන් ගොඩාක් පරිස්සම් කළ නිසයි. අම්මා අපට අනතුරක් වේවි යන බයෙන් කෑමෙන් බීමෙන්, යන එන ඇවිදින හැටියෙන් පවා පරිස්සම ගැන බැලුවා. කුස තුළ අපි දඟලද්දි, අතපය දිගු කරද්දි අම්මා ගොඩාක් අපහසුකම් ආදරයෙන් ම විඳ දරා ගත්තා. අපි ඉපදුණාට පස්සේ අත්පා පිරිමැද මැද, කලට වේලාවට කවා පොවා සතපවමින්, ලෙඩක් දුකක් ගැහැටක් වන්නට ඉඩක් නොතබා දිවා රෑ බොහෝම පරිස්සම් කළා. අපි කවුරුවත් දන්නේ නෑ අපි වෙනුවෙන් අම්මා, තාත්තා නිදි වැරූ තරම්... අපි වෙනුවෙන් අම්මා තාත්තා කුසගින්නේ සිටි තරම්... අපි වෙනුවෙන් අම්මා තාත්තා වෙහෙසුණු තරම්...

ඒ මහා කැප කිරීමේ ප්‍රතිඵලය තමයි දුවේ පුතේ, අපි මේ සුගති ලෝකයට අප ව ගෙන ඇවිත්, රැකවරණ මැද අප හදා වඩා ගනිමින් අම්මාත්, තාත්තාත් සිදු කළ උපකාරය මෙතෙකැයි කියා පමණ කළ නොහැක්කක්. තුන්ලොවේ සැඟවුණු කිසිත් නොමැති අසිරිමත් ප්‍රඥා ඇති සම්මා සම්බුදුරජාණන් වහන්සේ වදාළේ යම් කෙනෙක් අවුරුදු සියයක් පුරා මව පියා දෙදෙනා දෙඋරේ තබාගෙන කවමින්, පොවමින්, නහවමින්, සතපවමින් පෝෂණය කළා වුවත් මවටත්, පියාටත් ඇති ණය නම් නොගෙවෙන බවයි.

දුවේ පුතේ, සඟ ගුණ කියා වන්දනා කරද්දී “ආහුණෙය්‍ය” කියා අප වන්දනා කරනවා. ඒ ගුණයෙන් කියවෙන්නේ සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සඟ රුවන දුර ඈත සිට වුවත් දන් පැන් ගෙනවිත් පුදා උපස්ථාන කරන්නට සුදුසු බවයි. සඟ රුවන හැරුණු

කොට ඒ ගුණයෙන් ම යුතු යැයි සම්බුදුරජාණන් වහන්සේ වදාරා තිබෙන්නේ අම්මා, තාත්තා ගැනයි. දුවේ පුතේ, අම්මා තාත්තා ද ආහුණෙය්‍ය ගුණ යුතු උතුමන්. දුර සිට වුවත් පැමිණ වැඳුම් පිදුම් කරන්නට සුදුසු වූ, නිවසේ වසන බ්‍රහ්මයන් වූ මාපියන් අප විසින් නිතින් ගරු බුහුමන් දක්වන්නට අත්‍යන්තයෙන් ම සුදුසුයි...!

නිවසේ දී පටන් ගන්නා ජීවිත පාඩම් ඉගෙන ගැන්ම ඊළඟට යොමු වන්නේ පාසල වෙත. අම්මා තාත්තා විසින් පදනම් සකසන ලද අපේ ජීවිත අනාගතයේ යහපත් මිනිසුන් ලෙස වැඩී වර්ධනය වී යන්නේ ගුරු මාපියවරුන්ගේ මඟ පෙන්වීමෙන්. සෑම ජීවිතයක ම ගුරුවරුන්ගේ මැදිහත් වීම තුළ සිදු කෙරෙන වෙනස් වීම් ප්‍රමාණය සුළුපටු නැහැ. තමන්ගේ නොවන දරුවන් තමන්ගේ ලෙසින් ම ගෙන ජීවිතයේ යහපත වෙත පමුණුවනවා කියන්නේ භාරදූර කාර්යයක්. එය හුදෙක් වෘත්තියක් පමණක් නො වෙයි; මහානීය මෙහෙවරක්.

ගුරුවරුන් සමීපයේ අප ඉගෙන ගන්නේ පොත පතේ ඇති දේ පමණක් නොවෙයි. ජීවිතයේ ගුණධර්ම වඩන අයුරත්, අභියෝග යන්ට මුහුණ දෙන අයුරත්, නුවණින් සේ ම ගුණ සුවඳින් ද වැඩී යන අයුරත් යන සියල්ල ම අප බොහෝ සෙයින් ම ඉගෙන ගන්නේ ගුරු මාපියන්ගෙන්. සම්බුදුරජාණන් වහන්සේ ගුරුවර පිරිස හඳුන්වා දුන්නේ නමස්කාර කළ යුතු දකුණු දිශාව වශයෙනුයි. සිප් සතර බෙදා දෙන, මැණිකක් ඔප දමන ලෙසින් හැකියාවන් ඔප දමන, නොසඟවා සියලු දැනුම බෙදාලන, සමාජයේ ඉහළ ස්ථරයන්ට හැකියා පිරිපුන් ස්වකීය සිසු දරුවන් හඳුන්වා දෙන ගුරු මාපියන් හට අත්පා මෙහෙවරින් පවා කෘතගුණ දැක්වීම දුරාතීතයේ සිදු කෙරුණා. අද වද්දී නම් එය වැටුප් ගෙවන වෘත්තියක් නිසා සිසු සිසුවියන් ගුරු නිවසේ නතර වී ඇප උපස්ථාන කිරීම් දක්නට ලැබෙන්නේ නැහැ. අද සමාජයීය තත්ත්වය එසේ වුණත් ගුරු මාපියවරුන් නිසැකයෙන් ම අත්පා මෙහෙවරින් පවා ගෝල පිරිස විසින් සලකනු ලබන්නට සුදුසු උතුමන්... ඉදින් ඒ උතුමන් දුටු කල්හි අසුනින් නැගිටීම්, වැඳුම් පිදුම් කිරීම්, ගරු සත්කාර දැක්වීම් ආදී වශයෙන් විශේෂ කොට සැලකිලි දක්වන්නට නිසැකයෙන් ම සුදුසුයි.

දෙමාපියනුත්, ගුරුවරුනුත් සේ ම සමාජයේ අපට මුණගැසෙන ගෞරවනීය පිරිස තමයි වැඩිහිටියන්. සාමාන්‍යයෙන් වැඩිහිටියන් ලෙසින් සැලකෙන්නේ වයසින් අපට වඩා වැඩිමහලු වූවන්. ඒ වැඩිහිටිභාවය සැලසෙන්නේ වයෝවෘද්ධ නම් ගුණයෙන්. සීල තපෝ ගුණයෙන් අපට වඩා උසස් තලයන්ගේ පිහිටි පිරිස් අපට වයසින් බාල වූවත් සීලවෘද්ධ, තපෝවෘද්ධ බවින් ඔවුන් අපට වඩා වැඩිහිටියන්. උසස් ගුණධර්මයන්ගෙන් යුතු වීමෙන් ලබන වැඩිහිටි භාවය 'ගුණවෘද්ධ භාවය' ලෙස හැඳින්වෙනවා. එසේ නොයෙක් ආකාරයෙන් වැඩිහිටි භාවය අර්ථ දැක්වුණත් පොදුවේ වැඩිහිටියන් යන ව්‍යවහාරය වයසින් වැඩිමහලු බව භාවය සමඟයි තීරණය වන්නේ.

ශාසනික ව නම් වැඩිමහලු බව තීරණය කරන්නේ වස් සමාදන් වීම් ප්‍රමාණයෙන්. යම් දිනක පැවිදි වූ සාමණේරයන් වහන්සේ නමක් එදින ම අරහත්වයට පත් වූවත් වස් සමාදන් වීම් වශයෙන් එකක් හෝ ඇති ස්වාමීන් වහන්සේලාට උන්වහන්සේ විසින් වත් පිළිවෙත් කිරීමෙන් උපස්ථාන සිදු කරනු ලබනවා. එය යි ශාසනයේ පැනවෙන්නේ.

දුවේ පුතේ, වයසින් වැඩිමහල්ලන්ට සැලකීම බෝසත් ගුණයක් ලෙසින් අතීතයේ පටන් පිළිගැනුනා. අප මහ බෝසතාණන් වහන්සේ වටු කුරුල්ලෙකු ව උපන් පෙර භවයක දී මිතුරන් ලෙසින් ඇසුරට පත් වූ වඳුරෙකුත්, හස්තියෙකුත් සමඟ තමන් අතරින් වයසින් වැඩිමහල්ලා තෝරාගෙන සත්කාර කිරීමට සැලසුම් කළ අයුරු තිත්තිර ජාතකයේ විස්තර වනවා. බෝසත් අවධියේ පටන් අපගේ ශාස්තෘන් වහන්සේ වැඩිහිටියන්ට සැලකීම හෙවත් වෘද්ධාපචායනයේ යෙදීම අගය කරනු ලැබුවා. සිල්වත් උතුමන්ට වන්දනා කරනවා නම්, නිතින් වෘද්ධාපචායනයේ යෙදනවා නම් ඒ කෙනා ආයු, වර්ණ, සැප, බල යන සතර ධර්මයන්ගෙන් වැඩී යන බව සම්බුදුරජාණන් වහන්සේ වදාළා.

දුටු විට හුනස්නෙන් නැගී සිටීම්, ආහාරපාන පිරිනැමීම්, කැවීම්, පෙවීම්, නැහැවීම් ආදියෙන් උපස්ථාන කිරීමට ඒ වැඩිහිටියන්

සුදුස්සන් වනවා පමණක් නො වෙයි; එසේ උපස්ථාන කිරීම තුළ අපට ද පින් රැස් වනවා.

කෙස් රැවුල් පැසී ගත් පිරිස් පමණක් නොව පවුලේ සිටින වැඩිමහලු සහෝදර, සහෝදරියනුත් වැඩිහිටි පිරිසක් ලෙසිනුයි අපේ ජීවිතයට සමීප වන්නේ. ඒ පිරිස් කෙරෙහි පවා ප්‍රිය වචනයෙන්, යහපත් හැසිරීමෙන්, කීකරු බවින් යුක්ත වීමෙන්, මනා කොට සවන් දීමෙන්, ඇප උපකාර කිරීමෙන් අප තුළ වැඩිහිටියන්ට ගරු සත්කාර කිරීම නම් වූ පින් පිරෙන ගුණධර්මය වැඩී යනවා.

දුවේ පුතේ, බලන්න... මෙසේ මාපියන්, ගුරුවරුන්, වැඩිහිටියන් වශයෙන් නිරන්තරයෙන් බොහෝ සෙයින් පින් රැස් කර ගත හැකි පුණ්‍ය ක්ෂේත්‍රයක් අප අවට තිබෙනවා නේ ද...! ඇති තැනත්, නැති තැනත් ඒ පිරිස කෙරෙහි ගරු බුහුමන් සහිත ව මෛත්‍රී සහගත වචනයෙන් යුතු වීමෙන්, මෛත්‍රී සහගත සිතුවිලි හැසිරවීමෙන් සහ මෛත්‍රී සහගතව කටයුතු කිරීමෙන් අපට පින් එල නෙළා ගන්නට පුළුවනි. ඇති තැන ගෞරවයෙන් සිට නැති තැන අවමන් කරනවා නම් එය අප සිදු කරන වංචාවක්, අප විසින් අපව ම රවටා ගැනීමක්. එසේ සිදු කරද්දී පිරිහී යන්නේ අප ම යි.

ජීවිතයේ සැප සැලසෙන පින් පුරා ගන්නට කැමති පින්වත් ඔබ මේ පින අත්හැර ගන්න එපා. පහසුවෙන් ම රැස් කර ගත හැකි මේ සොඳුරු පිනට ඔබ කැමති වෙන්න. දුවේ පුතේ, එවිට ඔබ උතුම් මනුෂ්‍ය ගුණධර්ම බබළවන සුජාත දරු පරපුරේ පුරුකක් බවට පත් වනවා. එසේ ගුණදහමින් වැඩී යන්නට පින්වත් ඔබට තෙරුවනේ ආශීර්වාදය සැලසේවා!

තෙරුවන් සරණයි!

# නිර්මාණ ඉසව්ව

පෑදියෙන් සිතුවමින් නිසඳැසින්
සුසැදි ඔබේ නිර්මාණ එකතුව



කාවින්ද්‍යා චමෝදි දියණිය විසින් චවූ නිර්මාණයක්...





තක්ෂිලා රූපසිංහ දියණිය විසින් චවූ නිර්මාණයක්...




අමාෂා නෙත්මිණී දියණිය විසින් චවූ නිර්මාණයක්...




ඉෂානි මධුෂිකා දියණිය විසින් චවූ නිර්මාණයක්...



ලක්මිණි ශ්‍රීමාලි දියණිය විසින් චවූ නිර්මාණයක්...



සංජන ප්‍රියනාත් පුතණුවන් විසින් චවූ නිර්මාණයක්...



නෙත්මි ශෂිකලා දියණිය විසින් චවූ නිර්මාණයක්...




සචිනි දියණිය විසින් එවූ නිර්මාණයක්...



ලක්ප්‍රිය සඳරුවන් පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



තිළිණි දියණිය විසින් එවූ නිර්මාණයක්...



ගිහාන් සංජය පුතණුවන් විසින් වූ නිර්මාණයක්...

හද පතුලේ සෙනෙහසින්
මා වැඩූ මෑණියණි පියාණෙනි
සිප් කිරෙන් මා පෙවූ
මගේ ගුරු මෑණියණි පියාණෙනි
නෙතින් දැක සැනසෙන්න
තවද පින් මදි වුවද
මගේ කැපකරු මව්නි පියාණෙනි
මෙතෙක් ආ දිවි මගේ
නෙත් නුවන් පාදවා
එළිය කළ මෑණියණි පියාණෙනි
උතුම් දළදා සමිඳු සරණයි...

උත්පලා දියණිය විසින් වූ නිර්මාණයක්...

ඔබ කැමති මාතෘකාවකින් ඕනෑම නිර්මාණයක් ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව අංශය වෙත යොමු කරන්න.

ශ්‍රද්ධා සමාජ සත්කාර අංශය, නො. 369, හේවාගම, කඩුවෙල.
www.shraddha.lk | edu@shraddha.lk

ලක්ෂ ගණනින් කල්ප දුරු කතර ගෙවාලා
දස මහා පාරමී වීර්යෙන් පුරාලා
තමන්ගේ අවසාන භවය ලෙස
සල් වනෙහි මවුන් මායා
කුසින් මේ ලොවට පහළවිය
අප මහා බෝසතුන්...
කුඩා කළ ගෙවාලා යොවුන් විය ලබාලා
උයන් සිරි බලනු රිසි
ගොසින් තම උයන වෙත
සතර මහ පෙර නිමිති
දැක සසර පිළිකුල්ම
ලොවක සැනසුම සොයා
ඇසළ පුන් සඳ කිරණ
මතින් නික්මුණ සේක
උතුම් මහ බෝසතුන්...
සය වසක් පුරා දුක් විඳවමින්
ලොව පිණිස නිවීමේ මග සොයා
එමග අවැඩය සිතා අන්තයන්ගෙන් මිදී
උතුම් වූ ඒ මැදුම් පිළිවෙතෙහි පියනගා
වෙසක් සඳ සිසිල මැද
විශ්වයේ සැබෑ තතු තම නැණින් පසක් කොට
මුළු ලොවක් සනසනා මගට
දොරගුලන් හැර තුන් ලොවට
අගු විය අප මහා බෝසතුන්...

මනුජ අනුහස් පුතණුවන් විසින් වූ නිර්මාණයක්...

සිප් සල නැමති ඔරු කඳ මත ගොඩවන්නේ
නුවණැස නැමති බලයෙන් එය පදවන්නේ
ගුණ නැණ නැමති සයුරය තරණය වන්නේ
ජය ටැඹ නැමති තොටුපළ වෙත නිති යන්නේ

වරක් හැරී බැලුවෝතින් පෙර දවස
කොතරම් කාලයක් නිකරුණේ සිටියා ද
පැයක්වත් වැඩ කළොත් අද දවස
ඒ ප්‍රතිඵල අද නොව හෙට දිනට

සැඩ රළ නැමති බාධක මග හරිමින්නේ
බාධකවලට නිති බාධා ගෙන දෙමිනේ
සිප් ජය නැමති දුපත මට දිස් වන්නේ
මගේ ජය ධජය එහි නංවා ජය ගන්නේ

ජිත්මිණී උදාරා දියණිය විසින් වූ නිර්මාණයක්...

# ධර්ම මාර්ගයේ හැසිරෙන පිනැත්තෝ වෙමු

අප පවුලේ ධර්ම මාර්ගයට යොමු වී සිටින්නේ මා සහ මගේ වැඩිමහල් දරුවා පමණි. මාගේ ස්වාමියා ද අනෙක් දරුවෝ ද කෙතරම් කරුණු කීව ද ධර්ම මාර්ගයට යොමු නොවෙති. මට ඔවුන් ගැන ඇත්තේ විශාල බියකි. මේ තත්වය ජය ගැනීමට ධර්මය ඇසුරින් දිය හැකි පිළිතුර පහදා දෙන්න.

මේ ප්‍රශ්නය අප සමාජයේ බොහෝ පවුල්වල දකින්නට ලැබෙන්නක්. සමහර පවුල්වල මවුපියන් ධර්ම මාර්ගයට යොමුවෙද්දී දරුවන්ට ඒ මාර්ගයට පිවිසෙන්නට බැහැ. ඒ වාගේ ම සමහර තැන්වල දරුවන් ඒ මාර්ගයට පිවිස සිටිද්දී මවුපියන්ට එසේ වන්නට නොහැකි වී තිබෙනවා. මේ හැමවිටක දී ම ධර්ම මාර්ගයට යොමු වූ පිරිස අන් පිරිස ගැන ශෝක කරනවා. ඊට හේතුව මේ සංසාර ගමනේ ඇති බියකරු බව ඔවුන්ට වැටහීමත්, අන් පිරිසට එය වටහා ගැනීමට නොහැකි වීම නිසා උපදින බියත්ය.

මේ ප්‍රශ්නයට පැහැදිලි පිළිතුරක් බුදුරජාණන්වහන්සේ දේශනා කොට තිබෙනවා. මේ ප්‍රශ්නයට අප පිළිතුරු සෙවීමට පෙර ප්‍රශ්නය ඇති වීමට හේතු වටහා ගත යුතුයි.

1. පින හා පව
2. සංසාරික පුරුදු (කර්මය)
3. ඇසුරු කරන අය
4. ආර්ථික පසුබිම

අප තථාගතයන්වහන්සේ නිදිගන්ඩ සූත්‍රයේ දී පැහැදිලි ලෙස වදාළා මනුෂ්‍ය ජීවිතයක් ලැබීම, ඒ ශරීරය සෝබමාන වීම, ඉහළ සමාජතලයක් හිමිවීම, පැවිදි බිමට පිවිසීම, සිතක සමාධියක් ඇති වීම, සම්පත් ලැබීම, සිල් ඇති වීම, මාර්ගඵල ලැබීම, පසේ බුදුරජාණන්වහන්සේ නමක් බවට පත්වීම එසේත් නැතහොත් සම්මා සම්බුද්ධත්වයට පත්වීම ආදී සියලු සිදුවන්නේ පින හේතුවෙන් බව.

මේ දේශනය තවදුරටත් හැදෑරීමේ දී අපට පෙනී යනවා කිසියම් පුද්ගලයෙකුට පින් නැතිනම්, තවත් අය මොන තරම් උත්සාහ කළත් ඒ පුද්ගලයා ගුණ දහම් වඩන මාර්ගයට උත්සාහ කළත් ඒ පුද්ගලයා ගුණ දහම් වඩන මාර්ගයට ඇතුළත් කළ නොහැකි බව. මෙය මේ සමාජයේ ඇතැම් දූ දරුවන්ට මෙන් ම මවුපියන්ට ද අදාළයි. එම නිසා ඔබට පෙනෙනවා නම් ඔබේ පවුලේ කිසියම් සාමාජිකයෙකුට කෙතරම් කරුණු ඉදිරිපත් කළත් ඒ පුද්ගලයා ධර්ම මාර්ගයට යොමු නොවනවා යැයි කියා එතැන දී ඔබ ඒ ගැන ශෝක කළ යුතු නැහැ. ඔබ හැකි පමණ ඒ පුද්ගලයාට පින් රැස්වන ආකාරයට කටයුතු කරන්නට යොමු කරන්නට යොමු කරවන්න. මෙවිට මේ පින් විපාක දිට්ඨධම්මවේදනීය වශයෙන් ඒ අයට ලැබී තත්ත්වය යහපත් විය හැකිය.

දෙවැනි කරුණ වන්නේ සංසාරික පුරුද්දයි, නැතහොත් කර්මයයි. ඇත්තෙන් ම පෙර ජීවිතවල අප විසින් කරන ලද විවිධ කර්ම හේතුවෙන් අපට සිතා ගත නොහැකි ආකාරයේ ගැටලු මේ ජීවිතයේ දී මතු විය හැකියි. ධර්ම මාර්ගයට යොමුවීමට සිත නොදීමත් එවැනි ම කාරණාවක් වන්නට පුළුවන්.

දැන් බලන්න අප දන්නවා නේ ඉසිදාසී කියන ඉතා සිල්වත්, ගුණවත් කාන්තාව ගේ කතා ප්‍රවෘත්තිය. ඈ කෙතරම් සිල්වත් ගුණවත් වූ නමුත් ඇගේ ස්වාමිවරුන්ට දාසියක සේ සේවය කළත් ඔවුන්ට ඈ එපා වුණා. මීට හේතුව පෙර ජීවිතයක දී ඈ වැරැදිකාම සේවනයේ යෙදීමයි.

ඒ වාගේ ම අපි යසෝදරා දේවිය ගේ පවුල අරගෙන බලමු. ඒ දේවිය රහත් වුණා. පුත් කුමරා වූ රාහුල, රහතන්වහන්සේ නමක් බවට පත් වුණා. ඊත් ඇගේ සහෝදරයාට මොකද වුණේ? දේවදත්ත නම් වූ ඒ සහෝදරයා බුදුරජාණන් වහන්සේ සමඟ සංසාරික

වෛරයකින් හිටියේ. මේ වෛරය දිගින් දිගට ම පැවතීම හේතුවෙන් දේවදත්තට නිරයයි හිමිවුණේ.

සැරියුත් මහරහතන්වහන්සේ ගේ පවුලේ උදවිය හැමෝම රහත් වුණත් අවසන් මොහොත දක්වා ඒ මවුට බැරිවුණා දියුණුවකට එන්න. ඈ මිථ්‍යාදෘෂ්ටිකවයි හිටියේ. අවසාන මොහොතේ තමයි ඈට පුළුවන් වුණේ සෝතාපන්න වීමට.

බුදුරජාණන්වහන්සේට කලක් උපස්ථාන කළ සුනක්කත්තට හිමිවුණේ නිරය. කෙතරම් උවටැන් කළත් ඔහුට බැරිවුණා නේ තථාගතයන්වහන්සේ ගැන පැහැදීමකට එන්න. ඉතිං මේ කරුණු අනුව අපට පැහැදිලි වන්නේ කුමක් ද ? ගුණධර්ම දියුණු කිරීම යනු සියල්ලන්ට ම එක සේ කළ හැකි කාරණාවක් නොවන බව නොවේ ද?

තුන් වැනි කරුණ නම් තමත් ඇසුරු කරන පුද්ගලයින් කවුරුන්ද යන බවයි. මවුපියන්ට වේවා, දරුවන්ට වේවා මේ තත්වය පොදුයි. තමා ඇසුරු කරන පුද්ගලයා අනුව ඒ ඒ අයගේ හැසිරීම් රටා ගොඩනැගෙනවා. අසත්පුරුෂයන් ඇසුරු කරන තරමට කෙනෙකු ගේ ජීවිතය විනාශ වී යනවා.

මේ කාරණාවේ දී මවුපියන්ට ඉතා වැදගත් කාර්යභාරයක් සිය පවුල තුළ තිබෙන බව අවධාරණය කළ යුතුයි. අද පොදු සමාජයේ පිළිගැනීමට අනුව මවුපියන් දරුවන් පෝෂණය කිරීම, අධ්‍යාපනය ලබාදීම, ලෙඩ දුකේ දී සැළකීම, කලට වේලාවට විවාහපත් කරදීම ආදිය තමයි කරන්නේ. එහෙත් මෙය පරිපූර්ණ ලෙස මා පිය යුතුකම් ඉටු කිරීමක් නම් නොවෙයි. මවුපියන් සිය දරුවන් තුළ ළමා වියේ පටන් ම බුදුගුණ පිළිබඳ මනා අවබෝධයක් ඇති කරවිය යුතුයි.

තෙරුවන් පිළිබඳ දරුවන් තුළ පැහැදිලි අවබෝධයක් මෙන් ම පැහැදීමක් ද ඇතිවන ආකාරයට ඔවුන් හික්මවිය යුතුයි. මෙවන් පරිසරයකදී දරුවන් තුළ ගුණ දහම් ඇතිවන ආකාරයට ඔවුන් හික්මවිය යුතුයි. මෙවන් පරිසරයක දී දරුවන් තුළ ගුණ දහම් වැඩෙනවා ම යි. මීට හේතුව පව් කිරීමට එවන් දරුවන් නොවෙයි. දරුවන්ට හොඳ සිහියෙන් යුතුව කටයුතු කිරීමේ හැකියාවක් ලැබෙනවා. ඒ වාගේ ම මේ හේතුවෙන් අකුසල් දුරු කිරීමටත්, කුසල් උපදවා ගැනීමටත් ආසා ඇති වීර්යවන්ත දරුවන් ඔබට දැක ගත හැකි වේවි. එසේම නිතර හඬන වැළපෙන කම්පා වෙන සිදුවීම් ඇතිවන මේ ලෝක ස්වභාවය වෙත යොමු වූ මනා පෞරුෂයක් ද මේ අනුව දරුවන් තුළ ඇතිවෙනවා මයි.

දැන් අපි දන්නවා පටාචාරාව මිනිසුන් හැඳින්වූයේ පිස්සියක් හැටියටයි. අංගුලිමාලට කීවේ මිනීමරුවෙක් කියා. සෝපාක, සුනීත වැනි අය අන්ත අසරණව යි උන්නේ. ඒත් මේ සියලු අය බුදුරජාණන්වහන්සේ සමීපයේ දී ඉතා ප්‍රබල චරිත බවට පත්වුණා නේද ? මීට හේතුව කුමක් ද ? කල්‍යාණ මිත්‍ර ඇසුරට යොමුවීමයි. පුද්ගලයකු සත්පුරුෂයකු කරවන්නේ ධර්මයෙන් ම යි. ඔබේ පවුලේ සාමාජිකයින් අතරින් ධර්ම මාර්ගයට යොමු වීමට නොහැකියාව ඇති අය ගේ මිත්‍රයන් ගැන ඔබ සැලකිලිමත් වන්න. එවිට ඔබට පෙනේවි ඒ මිතුරන් සත්පුරුෂයන් නොවන බව. මේ අය ධර්ම මාර්ග යට යොමු නොවීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ මුදවා ගැනීමට ඔබට හැකි නම් මේ තත්ත්වයට ඒ උත්සාහය කදිම පිළිතුරක් වේවි. මෙය දරුවන්ට සේම මීළඟ කාරණාව ආර්ථික පසු බිමයි.

අද සමාජයේ සමහරු ජීවත්වන්නට අන් ක්‍රමයක් නැති නිසා විවිධාකාර ලෙස සොරකම් කරති. මිනී මරති. වැරදි කාමසේවනයේ යෙදෙති. බොරු ගොත කියති. ඇතැම් විට මේ දේවල් කරන්නේ තමා ගත කරන ජීවිතය වඩා සැපදායි කරගැනීම පිණිසය. එහෙත් බෝග පිරිහුණු පමණින්, ඥාතීන් අහිමි වූ පමණින්, කිසිවකුත්

මරණින් පසු දුගතියේ උපදින්නේ නැත. එහෙත් මිථ්‍යාදෘෂ්ටික වීම, දුස්සීල වී මේ මහා සංසාර ගමනේ ඉතා ම කෙටි කාලසීමාවක් පමණක් ද ? ඔහුගේ පණ නල සිඳී ගිය සැණින් ඔහුට හිමිවන්නේ භයානක ඉරණමක් නොවේද ? මේවායේ විපාක මිනිස් ලෝකයේ වඩා වැඩියෙන් ම දුක් අනුභව කරන පුද්ගලයෙකුටත් වඩා සිය දහස් ගුණයක් දුක්ඛිත තත්ත්වයක් ඒ පුද්ගලයාට උදාකර දෙනවා ම යි. මිනිසෙකුට තම ජීවිතය පවත්වා ගැනීමට මුදල් අවශ්‍යවන නමුත් දිවිහිමියෙන් තමා ගේ ශීලය රැක ගැනීම ඉතා ම වැදගත් බව ඔබට මෙයින් වැටහෙනවා ඇති.

"යෝ මාතරං වා පිතරං වා මච්චෝ ධම්මේන පෝසති
තාය නං පාරිචරියාය මාතා පිතුසු පණ්ඩිතා
ඉධේව නං පසංසන්ති පෙච්ච සග්ගේ පමෝදතී'ති"

යමෙක් සිය මව්පියන් දැහැමිව පෝෂණය කරත්ද, මව්පියන්ට සේවය කිරීම හේතුවෙන් ඔහුව නුවණැත්තෝ මෙලොවදී ම පසසත්. පරලොව ද ඔහු සුගතියෙහි සතුටුවෙයි.

(මාතුපෝසක සූත්‍රය - බ්‍රාහ්මණ සංයුක්තය)

©2018 All Rights Reserved. Shraddha Media Network. No : 369, Hewagama, Kaduwela.
T.P. 0112 571 471 | Fax : 0112 548 400 | Web : www.shraddha.lk | Email : edu@shraddha.lk
www.facebook.com/ShraddhaTV www.youtube.com/ShraddhaTV www.google.com/+ShraddhaTV www.twitter.com/ShraddhaTV